
# භක්ති ප්‍රබෝධනය

භක්ති ප්‍රබෝධනය පවුලේ සඟරාව

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2020 ඔක්තෝබර් 121 වන කාණ්ඩය - 06 කලාපය පිටු 32 Q/D/03/පුවත්/2020



## විභාගය ඔබට අභාග්‍යයක්ද?

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

මිල රු.35/=
(සහන මිල)

# විභාගෙ විභාගේ........

ගී පද : සෝමලතා සුබසිංහ
සංගීතය : එම්. ආර්. චූලසිංහ
ගායනය : කෞශල්‍යා ප්‍රනාන්දු ඇතුළු පිරිස

පුන ගැයුම :
විභාගෙ විභාගේ එහෙ බැලූවත් විභාගේ
මෙහෙ බැලූවත් විභාගේ
විභාගේ තමයි අපේ අභාගේ...../ /

විහිලුවකට හිනාවකට විනෝදෙකට වෙන වැඩකට / /
නෑ වෙලාව විභාගේ / /
එකේ ඉඳන් දොළහ දක්වා ලොකු පොඩි සැම පන්තියකම
ඇතෙක් බරට විභාගේ
ඉරක් සඳක් ගහක් කොළක් මනුස්සයෙක් පේන්නෙ නෑ
සැප දුක අහන්නේ නෑ - කන්නෙ බොන්නෙ අඳින්නෙ නෑ
විභාගේ........

අම්මා තාත්තා අයියා අක්කා නංගි මල්ලි විතරක් යැ
නැන්ද මාමා බාප්පා මහප්ප යහළු යෙහෙළියෝ
අහළ පහළ අය
කොහොමද ළමයෝ විභාගේ
තව සුමානෙකින් ප්‍රතිඵල එයි
කොහොමද විභාගෙ ප්‍රතිඵල
ප්‍රතිඵල ප්‍රතිඵල ප්‍රතිඵල ප්‍රතිඵල
බස්සෙකේ කෝච්චියේ පාර තොටේදී
යන එන සැම තැන කොහොමද ප්‍රතිඵල / /
විභාගෙ ප්‍රතිඵල වසංගතේ.....

ඒ විතරක් යැ - විද්‍යා විෂයද කලාවද
කලාව කිව්වොත් මළා වගේ
චී චී චී ලැජ්ජ නැද්ද අපේ එකෙක් කලාව කරන්න
කවුද උඹ දිහා බලන්නේ විද්‍යාවයි ගණන් ගන්නෙ
අඩු තරමේ වාණිජවත්
ඉතින් පුතේ නම්බුවක්නෙ
කවුද උඹ දිහා බලන්නේ විද්‍යාවයි ගණන් ගන්නෙ
ජේල් වුණත් විද්‍යාවෙන් විභාගෙ කරලා

විභාගෙ විභාගේ ...../ /



විභාගය යනු මිනුම් දණ්ඩකි. අධ්‍යාපනය යනු සුපිපුණු, නිර්මාණශීලී, පරිණත, ප්‍රඥාවන්ත බව සපිරුණු මිනිසුන් බිහි කිරීමේ ක්‍රියාවලියයි. මේ ද්විත්වය පටලවාගත් පසු ගොඩ නැගෙනුයේ "විකෘතියක්" මැයි.

උක්ත ගීතය ඒ විකෘතිය පහදාලන සෝමලතා සුබසිංහගේ "විකෘති" වේදිකා නාටකයේ එන ජනකාන්තවූ ගීතයකි.

"විකෘතිය" මතුවී "අධ්‍යාපනය" වනසා නසා දමා ප්‍රකෘති මානව නිදහස් ප්‍රීති සහගත පැවතුම් ස්වභාවයම නසා දමන අයුරු මොනවට පහදාලන මේ නාටකයේ මුදුන් තේමාව අපූරුවට විදහාලන මේ නාටක ගීතය උචිත ලය ස්වර මානයන්ගෙන් හැඩව, අතදරුවාගේ පටන් උපාධි අපේක්ෂකයා දක්වා සිසු ප්‍රජාව පෙළන "විභාගය" නම් වූ මනෝභ්‍රාන්තිය අධ්‍යාපනයත් විභාගයත් එකිනෙක පටලවා තේරුම් ගැනීමේ ඛේදවාචකය විහිදාලයි.

විභාගය පොදුවේ සිසුන් පමණක් නොව මාපියන්ද පෙළන උපාය ශූර වෙළඳපොළ මැනැවින් අලෙවි කරවාලන අත්‍යවශ්‍ය තරගයක් කරවන මෙකල, පරිපීඩිත, විඩාබර, කඨෝර, වේදනාකාරී, අවතක්සේරුව හරහා අවප්‍රමාණික මනස් බහුතරයක් සදාලන වපසරියක් තුළ ජීවිත අභාග්‍යයක් මැයි. අපේ වැනි අවවර්ධිත රටවල මානව ජීවිතයේ තුනෙන් දෙකක සතුට වනසාලවන්නට "විභාගයට" ඉඩ දී නිර්මාණශීලී අධ්‍යාපනය නසා දමන අයුරු අභාග්‍යයක් මැයි.

- **සංජය නිර්මාල්** -



# භක්ති ප්‍රබෝධනය

**2020 ඔක්තෝම්බර් කලාපය**

**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී සුනිල් ප්‍රනාන්දු
පිලීෂන් අබයකෝන්

**කාර්යාලයීය සහාය**

දිනේෂා රණවක

**මුද්‍රණ සැලසුම**

භක්ති ප්‍රබෝධනය ග්‍රැෆික්ස්

**කවර නිර්මාණය**

සිසිර විජේතුංග ග්‍රැෆික්ස්

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව
3 හෙළිදරව්ව
4 නැණට මුසු විය යුතු යැ ගුණ
- නීටා අයි. ප්‍රනාන්දු
5 මුඩුබිම්-සරුබිම් වන්නා සේ ම පිබිදේ හැම දරුවන්
- මහාචාර්ය සරත් විජේසූරිය
6 COVID - 19 හා ආතතිය
- ගරු අචලා කොස්තා පැවිදි සොයුරිය
8 විභාගවලින් මනින අධ්‍යාපනය
- අති උතුම් මැක්ස්වල් සිල්වා රදගුරු හිමිපාණන්
9 අපේ ළමයින් රැක ගනිමු
- අත්තනායක එම්. හේරත්
10 තරගකාරී විභාගය හා වත්මන් ශිෂ්‍යයාගේ ඉරණම
- ශාන් ප්‍රනාන්දු
12 සමබර අධ්‍යාපනයක් - පිරිපුන් පුරවැසියෙක්
- බී. රූබි රුද්‍රිගු
14 අධ්‍යාපනයේ මිථ්‍යාව හා සත්‍යය
- මහින්ද නාමල්
16 ශිෂ්‍යත්වය - දමයන්ති ප්‍රනාන්දු
17 චුට්ටා - ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා
18 ටීචර්ට ලියුමක් - සංජීවනී දහනායක
20 අධ්‍යාපනය මොකටද?
- වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්
23 අමිතගේ හද ගැස්ම - සී. අමිත
24 ඕං එහෙනං - සූරිය මාමා - ජෝසප් ඩයස්
25 පුංචි විකුම් - සූරිය මාමා
ලොව සොඳුරුය - ඒ දෙව් පෙම
- එල්. කාවින්ද්‍යා දේශානි ප්‍රනාන්දු
26 ප්‍රහේලිකා අංක - 61
- ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා
27 අපේ ගුරුතුමිය
- W. M. තරුන්දි මීරියම් රවීණා ප්‍රනාන්දු
මරි මව්නි - වින්දන සාවින්ද
සොබා අසිරිය, මරි මවුගේ මාතාවෙනි
- එරේස් ප්‍රනාන්දු
28 කතෝලික ධර්මය අ.පො.ස. (සා./පෙළ) විභාගය 2020 ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I කොටස
- ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.
30 අ.පො.ස. (උ./පෙළ) ක්‍රිස්තියානි ධර්මය විශ්ව සහා ඉතිහාසය I - එස්. හේමාල් පෙරේරා
32 පාඨක හඬ - මංගල ජයවර්ධන

භක්ති ප්‍රබෝධනය

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




**කවරයේ කථාව**

ශ්‍රී ලංකාවේ පාසැල් යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගි වන ජාතික විභාග බොහෝවිට අප හඳුන්වන්නේ තරග විභාග ලෙසිනි. ඒ නයින් ගත්කල විභාග යනු එකිනෙකා පරයා නැගී සිටිය යුතු හුදෙක් තරගයක්ම පමණක් බව සිසුනට ඒත්තු ගැන්වී ඇත. මේ තරගයට මුහුණ දීමට ජීවිතයේ අත්‍යවශ්‍ය කාරණ පවා උගසේ තැබිය යුතුය. ක්‍රීඩාව, සතුටු සාමිචියේ කතාබහ කිරීම, අවමංගල්‍යයකට හෝ මංගල උත්සවයකට සහභාගි වීම, වන්දනා හෝ විනෝද ගමන් යාම ආදී අවස්ථා සියල්ල දරුවෝ අහිමි කර ගනිති. උදය වරුවේම පාසලේද, සවස් යාමයේ අමතර පන්තියේද, ඉගෙන ගන්නා දරු දැරියන් රාත්‍රිය වනවිට හෙම්බත් වී ඇත. සමහරුන්ට දැඩි පීඩනයක් ඇති වීම නිසා මානසික ආතතිය වැඩිවී කලකිරීම, එපාවීම, අසතුට, උදාසීනකම වැනි ස්වභාව හටගනියි. නිදි මරාගෙන කළ නොහැකි පාඩම් කිරීමට තැත් කරයි. පාඩම්වලින් ඉගෙන ගත් දෑ විභාග යෙන් පසු බහුතරයකට අමතක වේ. ළමා ජීවිත, නව යෞවනය අහිමි වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විභාග තරගය නිසා ඇති කරන මානසික ව්‍යාකූලතාව කවරයේ කථාවෙන් මතු කරයි.

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

## භක්ති ප්‍රබෝධනය

දායකත්වය එක් වසරකට - රු. 500.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය සය මසකට - රු. 250.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com

## BHAKTHI PRABODHANAYA

Local Subscription Rate.

Rs. 500.00 per year (Including Postage)
Rs. 250.00 per six months
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com

හෙළිදරව්ව

# විභාගය ඔබට අභාග්‍යයක්ද?

විභාගය වනාහි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විධිමත් අධ්‍යාපනය හරහා ලබා ගත් දැනුම කිසියම් කාල පරිච්ඡේදයකදී තක්සේරු කර ගන්නට භාවිත කරන ක්‍රමවේදයකි. දැනුම ගැන කථා කරන විට අධ්‍යාපනය අමතක කළ නොහැකිය. "අධ්‍යාපනය" හෙවත් ඉංග්‍රීසි භාෂාවෙන් "Education" යන වචනයේ මුල් තේරුම ලතින් භාෂාවේ "educere" (එඩුචෙරේ) යන වචනයෙන් මතුවන්නකි. "එඩුචෙරේ" යන ලතින් වචනයෙන් අදහස් වන්නේ "to draw out" or "lead out" එනම්; තියන දෙයක් ඇද ගැනීමක් හෝ නිසි අයුරින් මෙහෙයවීමක් ය. පුරාණ ග්‍රීසියේ ජීවත් වූ මහා දාර්ශනික සොක්‍රටීස්ට අනුව ශිෂ්‍ය අධ්‍යාපනය වනාහි ලිඳකින් වතුර ඇදීමක් වැනිය. ලිඳක ඕනෑතරම් ජලය ඇතත් එය ලබාගන්නට බාල්දියක් යොදා අදින්නට සිදුවේ. ඒ අනුව ගත් කල සිසුන් තුළ තිබෙන අවබෝධය මතුකර ගන්නට ඔවුනට අතහිත දීම, මෙහෙයවීම, අධ්‍යාපනයේ මූලිකම ඉලක්කයකි. එසේ කරන කල ඒ ක්‍රමවේදය ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් ලෙස හඳුනා ගැනේ.

මිනිසුන් තමා ලැබූ අධ්‍යාපනය තුළ විභාගවලට කොපමණ ලකුණු රැගෙන සමත් වුවත් ඒ දැනුම කොතෙක් දුරට තමන්ගේ ජීවිතය මෙන්ම අන් අයගේ ජීවිත ගරුකටයුතු ජීවිත පැවැත්මකට යොමු කිරීම සඳහා බලපා තිබේද යන්න විභාග සමත්වීමට සාපේක්ෂව සලකා බැලිය යුතුය. යහපත අයහපත, හොඳ නරක, යුක්තිය අයුක්තිය, නීති ගරුක අනෛතික, විනීතවීම අවිනීතවීම, වැනි ද්විත්ව ස්වභාව අතර වෙනස ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හඳුනා ගැනීමට ආකල්ප කුසලතා මෙන්ම පෞරුෂ වර්ධනය මෙහිදී වැදගත් ය.

වර්තමානයේ බොහෝ අධ්‍යාපන විශේෂඥයන් විවිධ සංවාදවලදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් පිළිබඳව කථා කරන නමුදු තවමත් ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් ප්‍රායෝගිකව දැක ගත නොහැකිය. වර්තමානයේ ශිෂ්‍ය පරපුර විභාග අධ්‍යාපනයේ වහලකු කර හමාරය. බහුතර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බිය ඇති කරන, ඇතැම් විට මානසික රෝගීන් කරන, තරගය දෙගුණ තෙගුණ කරන, නිර්මාණාත්මක හැකියාව මොට කරන, ආත්ම විශ්වාසය බංකොලොත් කරන, ගිරවුන් ලෙස කටපාඩම් කරන්නන් ඔසවා තබන, දක්ෂයන් කඳු මුදුනට රැගෙන යන, අදක්ෂයන් ප්‍රපාතයකට හෙළන සීමිත පිරිසකගේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය තුළ මතුකර ඇති දැනුම තක්සේරු කරන විභාග අද අපට දැක ගත හැකිය, මෙවන් විභාග හරහා සමත්වීම සහ අසමත්වීම හෝ ඉහළ පහළ ලකුණු මට්ටම්වලින් ශ්‍රේණිගත කිරීම තුළින් රටකට ඵලදායී පුරවැසියන් බිහිකළ හැකිද යන්න උභතෝකෝටික ප්‍රශ්නයකි. ලාංකික සමාජය දෙස බලන කල විභාග සමත් ඇතැම් උගත් හොරුන් රටට විනකරන අන්දම ඉතා ශෝචනීය ය.

"විභාගෙ විභාගේ විභාගේ තමයි අපේ අභාගේ" 'විකෘති' නාට්‍යයේ ගීතයක ඇති මෙවදන් එදා මෙන්ම අදටත් බොහෝ සිසුනට බලපා ඇත. විභාගයකට මුහුණ දෙන්නට ආසන්න වන විට විභාගයට ලියන්නට ආත්ම විශ්වාසය නැතිකම, පාඩම් නොකළත් මහන්සි නොවුණත් අදෘශ්‍යමාන හස්තයක් පෑනට, පැන්සලට, අඩි රූලට, මොළයට, අතට ආරෝපණය කළ හැකි යයි පවසන විජ්ජාකරුවනට මුළාවන ඇතැම් දෙමව්පියන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අන්ධ විශ්වාසයක කොටස්කරුවන් වීම අධ්‍යාපනයේ ප්‍රධානම අපේක්ෂාවක් බිඳ වැටීමක් ය. එපමණක් නොව ලැබෙන විභාග ප්‍රතිඵලය බාර ගැනීමට මැලි වී තම ජීවිතයෙන්ද ඇතැම් සිසුන් සමුගැනීම නිතර නිතර වාර්තා වේ.

සංඛ්‍යාවෙන් වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් සහභාගී වුවද, සුදුසුකම් තිබියදීත් ඉතා අඩු සංඛ්‍යාවක් විශ්ව විද්‍යාලයවලට තෝරා ගැනීම නිසා අද උසස් පෙළ විභාගය ඇතැම් සිසුන්ට ඛේදවාචකයක් වී ඇත. දක්ෂ ශිෂ්‍යයන් වර්ණනා කරමින් ඔවුන්ව ඉහළටම ඔසවන, අදක්ෂ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අධ්‍යාපනය එපා කරවා ඔවුන් තුළ හීනමානයක් ඇතිකරවන තත්ත්වයක් මේ විභාග ක්‍රමය හරහා නිර්මාණය වීම

කාට නැවැත්විය හැකිද? පාසැල් අධ්‍යාපනය හැල්ලු කරන ටියුෂන් පන්තිය ඉහළට ඔසවන රටාවක් මේ විභාග ක්‍රමය ඔස්සේ ගම්‍ය නොවන්නේද?

ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය, වටිනාකම්, පිරිසිදුකම, පිළිවෙල, කැපවීම, නොපසුබට උත්සාහය, යහපත්කම, අවංකකම, වැනි සමාජයක් ගොඩ නගන්නට අත්‍යවශ්‍ය පුරවැසි වටිනාකම් මනින්නට මෙකී විභාග ක්‍රමයේ නිර්ණායක නොවීම අධ්‍යාපන ක්‍රමයේ මෙන්ම විභාග ක්‍රමයේද අභාග්‍යයකි.

විභාග ඉහළින් සමත් වීම සමාජය තුළ පිළිගැනීමක් ඇති වී තිබෙන නිසාම ඕනෑම උප්පරවැට්ටියක් යොදා එය හොඳින් හෝ නරකින් කර ගන්නට දරන වෑයමේදී ඇතැම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් කොපි කරන්නට පවා අද පෙළඹී ඇත්තේ මේ විභාග ක්‍රමය නිසා නොවිය හැකිද? ඉතා සූක්ෂ්ම ලෙස කොපි කරන්නන් බොහෝ විට හසු නොවන්නේ ඇතැම් විභාග පරීක්ෂකවරුන් තම පෞද්ගලික හේතු මත නොදැක්කා සේ සිටින නිසාය යන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අදහසය. සැබෑ කැපකිරීම් කර අධ්‍යාපනයට යොමුවූ වෙහෙස මහන්සි වන දරු දැරියන්ට එසේ කරන සිසුහු බලවත් අසාධාරණයක් කරති.

විභාග ඉදිරිපත් කර ඇති ආකාරය නිසාම ශිෂ්‍ය පරපුර විනාශ කරවන ඇතැම් විට විකෘත, හිතක් පපුවක් නැති, අසංවේදී, වග නොකියන, යුතුකම් පැහැර හරින, මුසා බස් දොඩන, ප්‍රතිපත්තියක් නැති, ගරු සරු නැති, හැඟීම් පාලනය නොකරන, හිංසාවට ප්‍රිය කරන, ආත්මාර්ථකාමී සිසු පරපුරක් වර්ධනය වීම රටක අනාගතයට අහිතකරය.

කොරෝනා වයිරසය නිසා විභාග කල් යාමත් සමඟ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගණනාවකට ඇති වූ අසහනය අවිනිශ්චිතතාව, බිය, අපේක්ෂා භංගත්වය, කලකිරීම, ආතතිය වැනි මානසික තත්ත්ව ආමන්ත්‍රණය කිරීම සහ ඔවුන්ව සුවපත් කර ගැනීම, විභාග පැවැතීම මෙන්ම අතිශයින් වැදගත් ක්‍රියාවලියකි. එසේ නොවුණොත් 'විභාගෙ තමයි අපේ අභාගේ' යන්න වත්මන් සිසු පරපුරද සිතීම සහ පැවසීම නිරායාසයෙන්ම සිදුවේ.

# නැණට මුසු විය යුතු යැ ගුණ

"දිසාපාමොක්" ඇදුරු
සිසු පිරිවර සමඟ යද්දි ස්නානයට
එමඟ අසල මාගලක අතුළ තල ඇට
තිබුණි දමා, වියැළෙන්නට

එක් දිනක්, දෙදිනක්
ගෙනෑ අහුරු සපමින්
බඹදත් කුමරු කෙළි දෙලෙන්
කළේලු මැලි කතකට රිදවුම්
පාඩුව ඉවසනු බැරිව ඈ කළ පැමිණිල්ලට
දුන්නේලු දඬුවම්.....
තලා උණ පත්තකින්
හික්ම වන්නට - ඇදුරිඳු

"රජ" කුල අධිමානයෙන්
මත්වැ සිටි එ කුමරුන්
බැඳ වෛර - ඇදුරු තුම වෙත
ලැබ ගත් විට, "රාජශ්‍රීය"
පළි ගන්නෙමැ'යි කළෙලු අදිටන්

කාලයාගේ ඇවෑමෙන්.....
ඇදුරිඳුගේ ඔවදනින්
දූන හැඳින තම වරදේ තරම
පිළිගත්තේලු - නැමඳ පා කමල
ඉල්ලා කමාව!

පන්සිය පනස් ජාතක පොතේ
"තිල මුට්ඨි" ජාතකය
කියැවුයෙමි, හමුවූ පෙළ පොතකින්

සිප් සතර පමණ නොව
හරි - වැරදි කියා දෙන
මෙත් වඩන ගුණ නුවණ
දරුවන්ගේ සුමඟ - පාදන
දේශයට පෙම් පුදන
අවැසිමැයි "දිසාපාමොක්ලා"
දයේ සෙසු දරුවනට
ලෞකික ජය ම නොව
ලොව්තුරුවූ සුව ද කැඳවන
සිප් කිරෙන ලබන "රස"
අමා රස මැයි දූය නගන

**නීටා අයි. ප්‍රනාන්දු**
කඳාන

# මුඩුබිම්-සරුබිම් වන්නා සේ ම පිබිදේ හැම දරුවන්

දිගු කලක් සේවය කළ ගුරු භවතුන් පිරිසකගෙන් මම ප්‍රශ්නයක් ඇසුවෙමි.

"ඔබ ඔබේ වෘත්තීය ජීවිතය අද සිහි කරන විට සතුටු වන්නේද?"

"ඔව්. ඇත්තටම ඔව්"

"ඊට හේතු කවරේද?"

"අපෙන් ඉගෙනගත් ළමයි හුඟක් ඉහළ තැන්වල ඉන්නවා. දොස්තරල, ඉංජිනේරුවො, ගණකාධිකාරීවරු ඒ විතරක් නෙමේ මහාචාර්යවරුත් ඉන්නවා".

"හොඳයි"

මම මෙසේද ඇසුවෙමි.

"හිරගෙට යන්න තුඩුදෙන අයුරින් කටයුතු කරමින් සිටි කිසිවකු හෝ ඔබ නිසා යහපත් පුරවැසියකු ලෙස අද ජීවත් වන්නේද? ඔබෙන් ඉගෙන ගත් යම් කෙනකු හිරගෙදරක හෝ සමාජ විරෝධී කටයුත්තක යෙදී සිටින්නේද?"

සියලුදෙනාගේ මුහුණුවලින් අමනාපයක් දිස්වේ. ඒ කිම?

සාරවත් අස්වැන්න අපට සතුටකි. ඊට අයිතිවාසිකම් කියන්නට අපි සතුටු වෙමු. එහෙත් නිසරු පල අපට නොසතුටකි. ඊට අපේ යම් සම්බන්ධයක් හෝ අපි සිහිකරන්නට අකැමැත්තෙමු. මතු දැක්වෙන කවි පෙළ කියවමු.



## විශ්‍රාම ගිය ගණිත ගුරුවරයා දුටු අදක්ෂ ආදි ශිෂ්‍යයා

හිටපුදෙන් එළවළු බක්කිය ළඟ හිටගෙන
හිතපුදෙන් ඕනෑ දෙයක් මං ගැන
පැනලා නොකියමි - හඳුනනකං
විස්තර නොකරමි - ගුරු ගෝල කං
මතකයි ඇදපු හැටි යටි බඩෙන්
කොනිත්තා බුරිය ලඟ හෙමෙන්
තියපු හැටි ගිනි අව්වෙ දණින්
ගහපු හැටි ඇඟිලි පහ උඩට
අඩි කෝදුවෙන්.....

තළන්නටම හිතාගෙන වේවැලක් ගෙන
මුහුණේ සිනාවක්, තෙතක්, දයාවක් නොමැතිව
එදා..... දේවදත්තයා ලෙස පැමිණි මොහු
දැන්..... වියපත් ය. පැන්ෂන් ය. තැන්පත් ය.
මොළේ ඇති එවුන්වම වර්ණනා කොට
උන්ටම ලකුණු දී සම්මාන දී
මං වගේ දුර්වලයන්ට, තළා පෙළා හිංසා කොට
පාසල අපායක් කළ මොහු.....
නුඹ නිසා තිත්ත වුණි මට පාසල් යාම
නැවතුණෙමි හඬ හඬා
අන්තිමේ - ගියෙමි තාත්තා ගිය මඟ
ටවුමෙ එළවළු විකුණන්නට (දැන් මට හොඳයි)

නුඹද, නුඹේ දක්ෂ ගෝලයෝ සැවොම ද
දැන් නිතර එති මා ලඟට - මගේ කඩයට
එදා බැරි වූ ගණන් - දැන් පෙන්වමි නුඹලා සැමට
කිරා දෙමි හාරසීය - පන්සීයට

**- පුෂ්පසිරි දයාවංශ කෝට්ටගේ -**

විෂය කරුණු ඉගැන්වීම මෙන්ම දරුවකු යහපත් පුරවැසියකු ලෙස සමාජයට එක් කිරීම ද පාසල සතු වගකීමකි. ඒ වගකීම ඉටුකළ යුත්තේ ආදරයෙනි. දයාවෙනි. මේ වනාහි දරුවන් තුළ ආකල්ප වර්ධනය උදෙසා නිර්මාණශීලීව මැදිහත්වීමකි.

උපුටා ගැනීම : 'ගුරු භූමිකාවට පෙරවදනක්'
**මහාචාර්ය සරත් විජේසූරිය**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (සිංහල අංශය)
කොළඹ විශ්ව විද්‍යාලය

# COVID - 19 හා ආතතිය

**(සැප්තැම්බර් කලාපයේ පළවූ ලිපියේ ඉතිරි කොටස)**

සංඛ්‍යාලේඛන වලින් තහවුරු කළ නොහැකි වුවත් මීට අමතරව තව බොහෝ මානසික අරගල එදිනෙදා ජීවිතය තුළ අපට තව හමුවේ. වරක් මට හමු වූ එක්තරා කතෝලික කාන්තාවකගේ අත්දැකීම මෙහිදී සඳහන් කිරීම යෝග්‍ය යැයි සිතමි. ඇයගේ මුනුබුරා 1 ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. පසුගිය කාලයේ නිවසටම එවන පාඩම් මාලා සමඟ වාඩි වී සිටි පුංචි පුතා එක් වරම "ජේසුට නං මුකුත් තේරෙන්නෙ නැහැ. එයා ඉන්නේ උඩ නේ. මෙච්චර වැඩ ගොඩක් කරන්න බෑ අපි පුංචියි කියලා එයා දන්නෙ නෑනෙ" යැයි පවසා ඇත. නොතේරෙන සුරතල් බසින් කීවත් ඒ තුළ සත්‍යයක් ද ගැබ් වී ඇත. ඇඳිරි නීතිය පැණවෙත්ම මුලින් ම සතුටු වූවෝ පාසල් යන දරුවෝ ය. අවුරුදු නිවාඩුවත් පාස්කු නිවාඩුවත් මේ තරම් දීර්ඝ කාලයක් තම පවුලේ අය සමඟ එක්ව ගෙවන්නට කිසි දිනක ලැබෙනු ඇතැයි ඔවුන් සිහිනයකිදු නොසිතන්නට ඇත. එහෙත් දරුවන්ගේ කෙළිදොළ සහ රූපවාහිනී කථාමාලා / කාටූන් බැලීම වැඩිකල් දරා සිටින්නට බැරි වූ පිරිසක් සිටිති. මොවුන්ගේ මුවින් නික්මෙන එකම වචනය "අපරාදෙ කාලය" යන්න යි. මේ නිසා ඇති හැකි අය හා පෞද්ගලික පාසල් අලුත් තරගයක් ආරම්භ කළහ. ඒ Online අධ්‍යාපනයයි. සහජ දක්ෂතා ඇති අයට මෙන්ම ගෙදර මේ සඳහා පහසුකම් ඇති අයටත් මෙය වරප්‍රසාදයක් බඳු විය. එයට ද හැකියාවක් නොමැති වූවෝ WhatsApp group හරහා පාඩම් සටහන් යවමින් දරුවන්ගේ පොත් පුරවන්නට වෙහෙසුණහ. එහෙත් ඒ අතරේ Smart ජංගම දුරකතනයක් හෝ නොමැති දෙමව්පියෝ COVID-19 අමතක කර දරුවන්ගේ කුස පුරවන්නට කෑම සොයා යන අතරේ උන්ගේ හිස පුරවන්නට සටහන් සොයා ගෙයින් ගෙට ගියහ. තනිව අධ්‍යයන කටයුතු කළ නොහැකි දරුවෝත් තමන්ට සහාය දෙන්නට අය නොමැති දරුවෝත් පත පොතෙන් ඈත් වූහ. මෙකී යථාර්ථයට අන්ධ වූ අපේ ඇතැම් පාසල්වල ඇතැම් ප්‍රධානීහු ගුරුවරුන් අමතමින් පාඩම් දරුවන්ට යවන බවට නිරන්තරයෙන් තහවුරු කරගන්නා අතරේ තමාගේ දරුවා පාඩම් සටහන් කර ගෙන අවසන් වූ වහාම තව සටහන් එවන මෙන් ගුරුවරුන්ට මතක් කිරීමට ද අමතක නොකළ දෙමාපියෝ වූහ. ඔවුන්ගේ අසල්වැසි නිවසේ වෙනත් පාසලකට යන තම දරුවාට සමවයස් දරුවෙක් සිටියහොත් තත්ත්වය තවත් බරපතළය. එවිට මේ සංවාදයට හා මතක් කිරීමට පාසල් අතර සංසන්දනය ද මාතෘකා විය. මෙහි අනික් ශෝචනීය පැතිකඩ දිගහැරෙන්නේ පාසල් ආරම්භ වූ විටය. දහම් පාසල්, විෂය නිර්දේශය, විභාග, සංගම් හා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වන තරග, අතරමැද අත්හිටවනු ලැබූ විෂය සමගාමී ව්‍යාපෘති, අමතර පන්තිවල ඉගෙනුම ආදි සියල්ල එකවර කෙටි කාලයකදී දරුවන්ට දීමට තැත් කළහොත් දරුවන් මෙන්ම ගුරුවරුන් ද වේගයෙන් දරුණු මානසික ආබාධවලට ගොදුරු වීම ද අනිවාර්ය වනු ඇත.

මේ අතරේ වෙනදා කරින් කර අත් යවමින් තැන්තැන්වල රංචු ගැසුණු තරුණයෝ නිවසේ කාමරවල, පුටුවල ඇඳන් මත තම ජංගම දුරකතනය සමඟ තනිවූහ. පිරිසක් තොරතුරු හා කවට වීඩියෝවලින් සෑහීමකට පත් වෙද්දී තවත් අය වීඩියෝ ක්‍රීඩාවලට ගොදුරු වෙමින් ඩිජිටල් තිරවලට ඇබ්බැහි වූ හ. මේ ඩිජිටල් මාපියාව නිසා හෙරොයින්වලට වඩා වැඩි මානසික ව්‍යාකූලතාවක් පුද්ගලයා තුළ ඇතිකරන අතර මොළයේ ස්නායු දුර්වල කිරීමෙහි ලා එය වැඩි බලපෑමක් ඇති කරන බව සොයාගෙන ඇත. COVID-19 අවසන් වෙතත් මෙයින් ඇතිවන මානසික ආබාධ හා අසහන දුරු කිරීමට තවත් බොහෝ කාලයක් ගත වනු නිසැකය.

පවුලක් ලෙස එක්ව ගත කිරීම ඉතා හොඳය. මව, පියා හා දරුවන් වශයෙන් එකිනෙකා සමඟ ජීවත්වීමට යටගියාවේ සීමා වූ කාලය වෙනුවට දැන් පමණට වඩා කාලය ලැබී ඇත. සැබෑ ආදරය, තේරුම් ගැනීම හා සාමය අත්දකින පවුල්වලට මෙය කදිම අවස්ථාවකි. එහෙත් අවාසනාවට ඇතැම් දෙමව්පියන්ට විවාහ වූ දා සිට දවසේ වැඩි කාලයක් එකට සිටි එකම අවස්ථාව ද මෙය විය. මේ හේතුවෙන් මෙතෙක් නුදුටු ගුණ - අගුණ දකින්නට අඹුසැමියන් යොමු වී ඇත. ගුණ නම් හොඳය. එහෙත් නොගැලපෙන විවාහ තුළ දරාගෙන ගිය පවුල් ජීවිත දෙදරා යන්නට ද මේ කාලය හේතු වී ඇත. මේ නිසා ම පවුල් ආරවුල්, ගෘහස්ථ හිංසනය, ලිංගික හිරිහැර කිරීම් ද මේ වනවිට වාර්තා වෙමින් පවතී. එක්තරා ගෘහිණියක් තම සැමියා රැ කියාවට ගිය පසු තම දෙමාපියන් හා මිතුරන් සමඟ දුරකථනයෙන් සුවදුක් විමසීමට පුරුදුව සිටියාය. COVID-19 සමඟ සැමියා උදේ වරුවේ නිවසට කොටුවී පීඩා විඳි අතර බිරිඳ සුපුරුදු ප්‍රීතියෙන්

කල් ගත කළා ය. මේ තත්ත්වය දරා ගත නොහැකි වූ සැමියා තම බිරිඳ අසංවේදී බවත් ඇයට අනියම් සබඳතාවක් ඇතැයි සැක පහළ වන බවත් පවසමින් දික්කසාද වීමට තීරණය කළේය. තවත් ප්‍රදේශයක බිරිඳක රාත්‍රියේ තම නිවසින් පලා ගොස් අසල්වැසි නිවසක සරණ පතා සිටියේ දිගින් දිගටම සැමියාගෙන් ලත් පහර ඉවසා ගත නොහැකිවය. රැකියා සඳහා පිටව යාමට නොහැකි නිසා සීමා සහිත වූ මෙවන් ප්‍රචණ්ඩ ක්‍රියා මේ කාලය තුළ සීමා මායිම් බිඳ දමා වර්ධනය වෙමින් තිබේ. මෙවන් වූ සත්‍ය කථා බොහොමයක් අපේ නිවෙස් තුළ සැඟවී ඇත.

සාමාන්‍ය ප්‍රජාව අතර මෙවන් මානසික අර්බුද හට ගනිද්දී COVID-19 මැඩ පැවැත්වීමෙහි ලා කැපවුණු සෞඛ්‍ය සේවකයන් හා නිරෝධායන කාර්යමණ්ඩල පිළිබඳව ද සැලකිලිමත් වීම වටී.

2003 SARS වයිරසය පැතිර ගිය අවස්ථාවේ දී නැගෙනහිර තායිවානයේ රෝහලක කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 338 දෙනෙකු අතර ආතති ප්‍රතික්‍රියාව පිළිබඳ කරන ලද අධ්‍යයනයකදී තහවුරු වූයේ ඔවුන් ගෙන් 5% ක් උග්‍ර ආතති ආබාධයකින් පෙළෙන බවයි. විශේෂයෙන්ම අධික වෙහෙසට පත්වීම, අන් අයගෙන් වෙන්වීම, උණ රෝගීන් සමඟ කටයුතු කිරීමේදී ඇතිවන කාංසාව, නුරුස්නා බව, නින්ද නොයාම, අවධානය යොමු කිරීමේ දුර්වලතාව, අවිනිශ්චිතතාව, කාර්ය සාධනය පිරිහීම සහ වැඩ කිරීමට අකැමති වීම හෝ ඉල්ලා අස් වීම ආදී තත්ත්ව සැලකිය යුතු ලෙස වාර්තා වූ බව සඳහන්ය. මේ අනුව නුදුරු අනාගතයේ දී අප රට තුළ ද ඇති විය හැකි මෙවැනි ඛේදජනක තත්ත්වවලට මුහුණ දීමට අදාළ බලධාරීන් කල් තියා සූදානම් ව සිටීම වැදගත් වේ.

කෙසේ වෙතත් COVID-19 වසංගතය අවසන් වූ පසුවත් පුද්ගලයන් අතර සමූහයා මඟ හැරීම, කැස්ස සහ කිවිසුම් යන පුද්ගලයන්, සංවෘත අවකාශ සහ පොදු අවකාශ ආදියෙන් වැළැකී සිටීම ආදී හැසිරීම් රටා වැඩි වීමක් සිදුවිය හැකිය. අනාගතය පිළිබඳ අවිනිශ්චිතතාව සහ අගුලු දැමීමේදී ආහාර සහ වෙනත් අත්‍යවශ්‍ය සැපයුම් ලබා ගත හැකිද යන්න පිළිබඳ කනස්සල්ලට පත්වීම සාමාන්‍ය ජනතාව අතර දීර්ඝ කාලීන බලපෑමක් ඇති කරනු ඇති අතර එය අත්‍යවශ්‍ය භාණ්ඩ ගබඩා කිරීම වැඩි කිරීමට හේතුවනු ඇත. තවද මානසික සෞඛ්‍ය ඒකක ප්‍රජා මනෝ වෛද්‍ය හෙදියන්ගේ සහ තැපැල් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව රෝගීන්ට ඖෂධ දීමට උත්සාහ කළද ප්‍රායෝගික සීමා තිබූ බව ද සැබෑවකි. ඒ සමඟ ම මනෝචිකිත්සක ඖෂධ අත්හිටුවීම හේතුවෙන් නුදුරු අනාගතයේ දී මනෝචිකිත්සක රෝග නැවත ඇතිවීමේ අනුපාතය ඉහළ යනු ඇතැයි ද පුරෝකථනය කළ හැකිය. එබැවින් මතු ප්‍රයෝජනය වෙනුවෙන් මානසික ආතතිය සමඟ සාර්ථකව කටයුතු කළ හැකි, ප්‍රායෝගික කුසලතා ඇති පුද්ගලයන් සන්නද්ධ කිරීමටත් සාමාන්‍ය ජනතාව අතර ස්වයං උපකාරක ක්‍රමවේද ප්‍රගුණ කිරීමටත් කල් තබා සැලසුම් කිරීම නුවණට හුරුය.

ඒ කෙසේ වුවත්, ශ්‍රී ලංකාව වැනි ආපදාවලට ලක්විය හැකි රටක අපේක්ෂා කළ හැකි තරම් ආපදා ආශ්‍රිත PTSD ව්‍යාප්තියක් පසුගිය කාලය පුරා දක්නට නොලැබිණි. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ PTSD ව්‍යාප්තිය පිළිබඳ කරන ලද අතීත අධ්‍යයනයකදී, අදාළ නියැදියෙන් සිටි පුද්ගලයන්ගෙන් 36.3% ක කම්පන සහගත සිදුවීම් වාර්තා කර තිබුණත් ඒ අතරින් ජීවිත කාලය පුරාම PTSD ව සිටියේ 2.0% ක් පමණකි. මෙයට හේතුව වන්නේ ශක්තිමත් ප්‍රජා සබඳතා මෙන්ම අර්බුදයකදී

17 වන පිටුවට.....

**ගරු අචලා කොස්තා පැවිදි සොයුරිය (ශු.ප.)**
මනෝ විද්‍යාව (ශාස්ත්‍රවේදී)
ශු. පවුලේ ආරාමය,
වාද්දුව.

## ශක්ති ප්‍රබෝධනය ඉදිරි තේමාවන්

**2020 නොවැම්බර් මාසය - "හමුවේ දිනක ඒ ලස්සන ලොවෙහි අප"**

**2020 දෙසැම්බර් මාසය - "දෙවිඳු උපන්නේය සතුනි දෙවිඳු උපන්නේය"**

(දෙසැම්බර් කලාපය සඳහා ඔබ එවන ලිපි ඔක්තොම්බර් 30 ට පෙර අප වෙත එවන්න.)

**2021 ජනවාරි මාසය - "මිහිතලයට පිහිතලය නොතබන්න"**

(ජනවාරි කලාපය සඳහා ඔබ එවන ලිපි නොවැම්බර් 30 ට පෙර අප වෙත එවන්න.)

# විභාගවලින් මනින (තක්සේරු කරන) අධ්‍යාපනය

යම්කිසි කෙනකු සාර්ථක පුද්ගලයකු වනු දැකීම හුදෙක් තම ආශාවයි. පරිසරයෙන්. අධ්‍යාපනික හා ආධ්‍යාත්මික ගුණ වගාවෙන් පිරුණු උසස් පුද්ගලයකු ලෙස සමාජයට මුහුණ දීමට හැකිවන්නේද ඒ තමා ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. ඒ සඳහා පාදක වන මාර්ගය කුමක්දැයි විශ්ලේෂණයට භාජනය කළොත් එය දැනුම හා සහජ හැකියාව තුළ අන්තර්ගතව සිදුවන්නක් වේ.

අප සමාජය තුළ ඕනෑම දෙයක වර්ධනයට හා වැටීමට තක්සේරු කරන ගණනයන් ඇත. දුර ගැන ගණනය කිරීමට අඩි, යාර, සැතපුම්, මීටර්, කිලෝමීටර් ලෙසින්ද, බර රාත්තල්, ග්‍රෑම්, කිලෝග්‍රෑම් ලෙසින්ද ගණනය කරනු ලබයි. ඒ වගේම අධ්‍යාපනය මැනෙන දර්ශකය වන්නේ විභාගයයි. දෙමාපියන් විසින් තම දරුවන් ළදරුවියේදීම මොන්ටිසෝරි අධ්‍යාපනයේ සිට අරඹන අධ්‍යාපනික දැනුම හරහා අවසන් දිනුම් කණුවේ ජයග්‍රහණය තීරණය කරනු ලබන්නේ විභාගයකිනි. විභාගය සමත් නම් දැනුම ඇති බව සහ අසමත් නම් දැනුම මදි බවත් උපකල්පනය කරනු ඇත. එසේ නම් යම් කිසි කෙනකු විභාග තක්සේරුව මඟින්ම ගන්නා තීරණ තීන්දු මතම ජීවිතය සාර්ථක වන්නේද? නොවන්නේද? යන්න සිතා බැලීම අගනා කර්තව්‍යයකි.

සිංහල භාෂා විශ්ව කෝෂයේ ප්‍රධාන කර්තෘ ලෙස ක්‍රියා කළ මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස මහතාගේ දහතුන්වන විශ්වකෝෂ කාණ්ඩයේ, ඥාන විභාගය, නමින් පරිච්ඡේදයක් ඇත. එහි ඥානය හෙවත් දැනුම ලැබීමේ ක්‍රමය පුළුල් ලෙස විස්තර කර දක්වයි. ඥාන විභාගයට යන්නට යෙදෙන EPISTEMOLOGY යන ඉංග්‍රීසි වචනය ග්‍රීක භාෂාවේ EPISTEME සහ LOGOS යන වචන දෙක එක්වීමෙන් නිෂ්පන්න වූවකි. EPISTEME යන්න ඥානය (KNOWLEDGE) යන අර්ථයයි. LOGOS (DISCOURSE) යන්නෙන් චින්තනය, අදහස, තර්කණය, මූලධර්මය, හේතුව, අනුශාසනය, සාකච්ඡා කිරීම වැනි අර්ථ දනවයි. එසේ අප ඒ ගැන අධ්‍යයනය කිරීම තුළ ඥාන විභාගය පුළුල් ක්ෂේත්‍රයක් කරා ගොඩනැගුණද, අද අපට රාජ්‍ය මට්ටමින් පවත්වන විභාගවලින් සමත්වීම තුළම මිනිස් වර්ගයාගේ අනාගතයම රඳා පවතින්නේද යන්න ප්‍රශ්නයක් වී නොමැත්තේද? එසේ නම්, අපි දෙවන පියවර කෙරේ සිතිය යුත්තේ විභාගය සමත්වීම හෝ අසමත්වීමට වඩා තමා සහජයෙන් උරුමකරගෙන එන තලෙන්තු තුළ නිර්මාණාත්මක නිපැයුම් හෝ සහජ හැකියා තුළින් ජීවිතය ජය ගැනීමේ මාර්ගයකට අවතීර්ණ වීමේ ආදීනවයට පා තැබීම නොවන්නේද?

ශ්‍රී ලංකාවේ යෞවන පරපුරේ ප්‍රාර්ථනා සඵල කර ගන්නට තුඩු දෙන කරුණක් වන්නේ රැකියාවක් ලබාගැනීමයි. ඒ සඳහා තමන් විසින් ලැබූ අධ්‍යාපනය මත ලද තක්සේරුවක් ඇති ඒ විවිධ විභාග සමත් වී තිබීමයි. රැකියා ලබාදීමට තීරණය කිරීමේදී ඒ සඳහා රාජ්‍ය මට්ටමින් ඉල්ලුම් කිරීම සඳහා විවිධ පුවත්පත්, සඟරා හෝ ජනමාධ්‍ය මගින් ප්‍රකාශ කරන දැන්වීම්වලදී යම් කිසි මට්ටමක් ක්‍රියාත්මක වේ. ඒ ඉල්ලන සුදුසුකම් සම්පූර්ණ කරන කෙනකුට ඒ සඳහා ඉල්ලුම් කළ හැකිය. එහෙත් බොහෝ වේලාවට විභාග දැනුමට වඩා සහජයෙන් ඇති දක්ෂතා, ප්‍රායෝගික දැනුමට මුල් තැනක් නැත. ඒ දුන්නත් අල්ප වශයෙනි.

අධ්‍යාපනය තුළින් සිදුවිය යුත්තේ දරුවා තුළ ඇති දේ (Educere) ඒ යහපත් ආකල්ප උඩට ගැනීමට සමත්විය යුතු බවයි, ඒ අනුව දැනුම, ආකල්ප, කුසලතා යන අංශත් මේ අධ්‍යාපනයට අයත් විය යුතුය. දැනුම තුළ අධ්‍යාපනයට පමණක් සීමා කිරීමෙන් අපි ලොකු අසාධාරණයක් සිදුකරන බව කිව යුතුව ඇත. විශේෂයෙන් ආගමක් තුළින් ඇති කර දෙන බලාපොරොත්තු ආධ්‍යාත්මික වශයෙන්ද පෝෂණය වන නිසාය. ඒ නිසා ඒ යහපත් ආකල්ප ලබාදීම තුළින්ම දිරිවඩන දරුවන්ගේ විවිධ කුසලතාවලින් පිරී ඇති බව ඒත්තු යනු ඇත. විශේෂයෙන් තාක්ෂණය, චිත්‍ර, නැටුම් ගැයුම්, මැටි කර්මාන්තය, කොහු කර්මාන්තය, කැටයම් කලාව වැනි දේවලින් උසස් කුසලතා දක්වා පෙන්නුම් කර ඇති නිසාය. ඒ අය (OL) හෝ (AL) විභාග සමත් නොවුණාට ප්‍රායෝගිකව කුසලතාවලින් පිරිපුන් අය වෙති. අපි අද විශේෂයෙන් සිත් යොමු කළ යුතු වන්නේ අන්න ඒ උදවිය දෙසටයි. අපි අධ්‍යාපනය ලබන අවධියේ අපට උගන්වපු ගුරුවරු මහා දැනුම් සම්භාරයක් තිබුණු අයයි. ඒ ගුරුවරුන්ගේ කුසලතාව කියන්නේ හරි පුදුමයි. එදා ලොකු

JUG එකක් අරගෙන පොඩි Mugs වලට දමුවා වගේ, යම් දෙයක් ඒ ගුරුවරුන් උගන්වන්නේද? ගෝලයෝද ඒ අතින් දනුම් සම්භාරයකින් පොහොනි වූවෝ වූහ. අන්න ඒ වගේ අදත් දරුවන් තුළ සැඟවී ඇති කුසලතා ඉස්මතු කර ගැනීමේ හැකියාව අපට ඇත්නම් ඔවුනුත් අධ්‍යාපනයෙන් පිරිපුන් පුද්ගලයන් වනු නොඅනුමානය. ඉන් රටට, දැයට ලොකු සේවාවක් සලසා ගැනීමේ වාසනාවද උදාවන බව කිව යුතුය.

පසුගිය කොරෝනා සමයේදී අප රටේ දරුවන්, තරුණතරුණියන් නිවෙස්වල රැඳී සිටින වකවානුවේදී විවිධ නව නිපැයුම් කිරීමට හුගක් අය පෙළඹුනහ. ඉතා සාර්ථකව පසුගිය දිනවල රූපවාහිනී නාලිකාවලින් අපට ඒ අයගේ හැකියාව දකගන්නට හැකිවිය. එහෙත් ඒ හැකියාව ඇති සුදුසු පුද්ගලයාට ඒ නිසි තැන දුන්නාද? නැතහොත් ලැබුණාද? නිසි දිරිදීම් සිදුවුණාද? ඔහු අගය කළාද යන්න ලොකු සැකයක්ද ඇතිවිය. උදාහරණයක් ලෙස අත් සෝදන යන්ත්‍ර, විෂබීජ රහිත කාමර පන්ති ඇතිකිරීම වැනි නව නිපැයුම් ඉදිරිපත් කළා මතකය. සමහරවිට ඒ නිපැයුම් බලාගෙන ඒවා කොපි කරගෙන වෙනත් අයගේ නම් ප්‍රසිද්ධියට පත් කර ගන්නට ක්‍රියා කළ බව දනගැනීමට ලැබුණි. මෙය ඇත්තටම අසාධාරණ ක්‍රියාවකි. නව නිපැයුම්කරුවන් හැඳිනගෙන ඔවුන් දිරිදීමට සුදුසු වැඩපිළිවෙලක් රජය මගින් සිදුකළ යුතුය. දරුවන්ගේ කුසලතා වර්ධනය කරමින්, දරුවා තුළ ඇති ඒ දනුම, අධ්‍යාපනයේදී මූලිකාංගයක් කොට සලකා දියුණු කර ගැනීමට අතහිත දිය යුතුව ඇත. කුසලතා පිරි නව නිපයුම්කරුවන් විභාගයම සමත් වීමම අත්‍යවශ්‍යයයි සිතන්නේ නැත. හැකියාව

19 වන පිටුවට.....

**අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්**
(කොළඹ සහායක රදගුරු)

# අපේ ළමයින් රැක ගනිමු

වර්තමාන ළමා පරපුර වැඩිහිටියන්ගේ ගොදුරක් බවට පත් වේගන එන බව පෙනේ. බොදු දහමෙන් හෝ කිතු දහමෙන් පාලනය කළ නොහැකි උවදුරක් බවට මෙය පත්ව තිබේ. මීට ප්‍රධානම හේතුව ලෙස මම දකින්නේ සතර මාධ්‍යවල බලපෑමයි. සමාජ මාධ්‍යජාලා මුදල් ඉපයීමේ අරමුණින් කරගෙන යන ව්‍යාපාර නිසා වැඩිහිටියන්ට ළමයින් අපයෝජනය කිරීමට දැඩි ඉඩකඩක් විවරකොට තිබේ. සමාජ මාධ්‍යජාලා හි ඇති වල් කතා නම් අංගය දෙස පරික්ෂාවෙන් බලන්න. මව හා ලිංගික ඇසුරට යන පුතාත් දුව හා ඇසුරු කරන පියාත් පිළිබඳ ප්‍රබලව මෙහි දිගින් දිගටම දක්වා තිබේ. ඒවා බලන දරුවන් තුළ අම්මා තාත්තා යනු තමන්ට සංවේදී චරිතයක් නොව කාමුක චරිතයක් බවට විපර්යාස කොට තිබේ. බුදු දහමත් කතෝලික දහමත් පමණක් නොව මුස්ලිම්, හින්දු ජන කොටස්වල පවා පාරම්පරිකව රැගෙන ආ සාරධර්ම මේ නිදහස් මාධ්‍යජාලා නිසා බරපතළ අභියෝග යකට ගොදුරු වෙමින් තිබේ. අප බොදු කිතුනු දහම් පාසැල් වර්ධනය කළත් ඊට පරිබාහිරව එකතු කරන පාසල් නොයන, පල්ලි නොයන බහුතරයක් දරුවෝ සිටිති. ඒ බහුතරය දැන් වැඩිහිටියන් දෙස බලන්නේ තමන්ට ගොදුරක් විය හැකි සත්ත්වයකු දෙස බලන හැඟීමකිනි. මේ සමාජ මාධ්‍යජාලා කරන විනාශය කෙතරම් බලවත් දැයි කිවහොත් සහරාන් කළ විනාශයට වඩා දෙයක් මේ සමාජ වෙබ් අඩවි කරමින් සිටී. මගේ කල්පනාව අනුව නම් රජය මීට මැදිහත් වී දරුවන් ලිංගික ගොදුරක් කර ඇති පරිසරයත් දරුවන් දෙමාපියන්ව ලිංගික ගොදුරක් කරන පරිසරයත් ඉක්මනින් වෙනස් කළ යුතුය. 'මැච්' සඳහාත් ඇමතිවරුන් පත් කළ රටේ දරුවන් සඳහා කළ විශේෂ සැලකිල්ලක් මට නොපෙනේ. පොලීසියට වාර්තාවන සිද්ධිවලට වඩා විශාල ප්‍රමාණයක් රට පුරා සිදු වේ. අවම වශයෙන් මහලු මැති ඇමතිවරුන් හැර පත්ව සිටින තරුණ මන්ත්‍රීවරුන්වත් මේ ගැන බලපෑම් කොට මේ තත්ත්වයට එරෙහි අලුත් නීති සකස් කළ යුතුය. මෙය මේ විදිහට ගියහොත් මේ අපරාධකරුවන් දුටු තැන මරා දමන කල්ලි බිහිවීම වැළැක්විය නොහැකිය. බොදු කිතුනු බලවේග එක්සත් කොට අප මේ ව්‍යසනයට එරෙහි විය යුතුය.

**අත්තනායක එම්. හේරත්**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

# තරගකාරී විභාගය හා වත්මන් ශිෂ්‍යයාගේ ඉරණම

අධ්‍යාපනය වනාහි පුද්ගලයා තුළ දැනුම, ආකල්ප, හා කුසලතා වර්ධනය කිරීමේ දීර්ඝකාලීන ක්‍රියාවලියකි. පවුල් සංස්ථාවත් සමාජ සංස්ථාවත් අතර මනා සම්බන්ධතාවක් ගොඩනගමින් දරුවකු සමාජානුයෝජන ක්‍රියාවලියට පදනම අධ්‍යාපනය තුළින් සකස් වේ. අතීතයේ පටන්ම මානව ශිෂ්ටාචාරයේ මූලික පදනම අධ්‍යාපනය තුළින් නිර්මාණය වී ඇති අතර මිනිසාගේ පරිණාමයේ හා දියුණුවේ මුල් අඩිතාලම එමගින් ගොඩනැගී ඇති බව ඉතා පැහැදිලිය. වර්තමාන ලෝකයේ විවිධ රටවල් විවිධ අරමුණු හා ප්‍රතිපත්ති කේන්ද්‍ර කරගනිමින් තම අධ්‍යාපන ක්‍රමවේද සකස් කර ඇති අතර මූලික වශයෙන්ම ඒ ක්‍රමවේද ශිෂ්‍ය කේන්ද්‍රීය වී ඇත. දැනුමින් හා කුසලතාවලින් පමණක් පරිපූර්ණ වූ දරුවන් රටට දැයට දායාද කිරීම අධ්‍යාපනයේ හුදු පරමාර්ථය නොවන අතර යහපත් ගුණධර්මවලින් හා සාරධර්මවලින් පෝෂණය වූ හොඳ පුරවැසියන් නිර්මාණය කිරීම අධ්‍යාපනයේ මූලික අරමුණයි.

වර්තමාන ලෝකයේ දියුණු වෙමින් පවතින රටක් ලෙස හඳුනාගෙන ඇති අප රට තුළද රටේ ජාතික අරමුණු හා ප්‍රතිපත්ති කේන්ද්‍ර කරගත් අධ්‍යාපන ක්‍රමවේදයක් පවතී. අතීතයේ පටන්ම පාසල් විශ්වවිද්‍යාල සහ අනිකුත් අධ්‍යාපන ආයතන ඇතුළත් විධිමත් අධ්‍යාපන ක්‍රමවේදයක් තුළින් අප රටේ ශිෂ්‍ය ප්‍රජාව පෝෂණය වුවද 1945, සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ මූලිකත්වය යටතේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් වන තෙක්ම ඒ අධ්‍යාපන ක්‍රමය ධනපති පන්තියට හා ප්‍රභූවරුන්ට පමණක් සීමා වූ එකක් විය. නිදහස් අධ්‍යාපනය තුළ පෙර පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා අධ්‍යාපනය නොමිලයේම ලබා ගැනීමට එදා පටන් අද දක්වා අප රටේ ශිෂ්‍ය ප්‍රජාවට වාසනාව උදා වී ඇත. කෙසේ නමුත් වර්තමානයේ අප රටේ අධ්‍යාපන ක්‍රමය තුළින් බලාපොරොත්තුවන අරමුණු සාධනීය මට්ටමකින් ළඟා කරගන්නේද යන්න පිළිබඳ ගැටලු මතු වී ඇති අතර එයට තුඩු දී ඇති විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳව සමාජයේ කතිකාවක් ගොඩනැගී ඇති බව පෙනේ.

අප රටේ වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ ශිෂ්‍ය මානසිකත්වය මූලික වශයෙන්ම නිර්මාණය කරන්නේ විභාගය යන්න මූලික කරගෙනය. 5 වසර ශිෂ්‍යත්වය ශිෂ්‍යයකු මුහුණ දෙන ප්‍රධානතම සහ මුල්ම තරගකාරී විභාගයයි. ඒ විභාගයට මුහුණදීමේ අරමුණ පිළිබඳ නිසියාකාර අවබෝධයක්වත් දරුවකු තුළ නොමැති තරමය. හුදෙක්ම වර්තමානයේ පෙර පාසලේ සිට 5 වසර දක්වාම දරුවා පාසලේ රැඳී සිටින කාලය පුරා දෙමාපියන්ටද පාසල තුළ රැඳී සිටින්නට සිදුව ඇත. දරුවාට වඩා දෙමාපියන්ගේ උනන්දුව මත ලියැවෙන විභාගයක් බවට ශිෂ්‍යත්වය පත්ව ඇත. මෑත කාලය දක්වාම 5 වසර ශිෂ්‍යත්ව විභාගය යන්න 6 ශ්‍රේණියට සිසුන් තෝරාගන්නා කඩඉම් විභාගයක් බවට පත්ව තිබිණි. එමගින් මනා දැනුමකින් යුත් දීප්තිමත් ශිෂ්‍ය පිරිසක් දිවයිනේ සුපිරිතම පාසල්වලට ඇතුළුවීමට වරම් ලබන අතර අනික් ශිෂ්‍යයන් සාමාන්‍ය පාසල්වල ඉගෙනුම් කටයුතු කරගෙන යා යුතුය. ශිෂ්‍යත්ව විභාගය තුළින් දරුවා තුළ ඇතිකරන 'පාස් ෆේල්' මානසිකත්වය දරුවාගේ පෞරුෂය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරයි. එමෙන්ම දැනුම ලැබීමෙන් පමණක් දියුණුව ළඟාකරගත හැකි බව දරුවාගේ මනසේ ධාරණය වන අතර ගුණධර්ම හා යහපත් ආකල්ප පරයා දැනුම පමණක් ලැබීමට දරුවාගේ මනස කෙමෙන් කෙමෙන් යොමුවේ.

ශිෂ්‍යයා 10 වසරට පා තබත්ම මීළඟට ඔහුව හෝ ඇයව සූදානම් කරන්නේ සාමාන්‍ය පෙළ විභාග යටයි. වර්තමානයේ සාමාන්‍ය පෙළ විභාගය එතරම් තරගකාරී ස්වරූපයක් නොගත්තද එයට මුහුණදෙන ශිෂ්‍යයා තුළ අවිවේකී බව නිර්මාණය කරන්නට ටියුෂන් ගුරුවරු මගබලා සිටිති. උදේ 7.30 සිට සවස 1.30 දක්වා පාසලේ රැඳී සිට නැවත සවස හය-හත දක්වා උපකාරක පන්තිවලට දුවන ශිෂ්‍ය පිරිසක් අද නිර්මාණය වී ඇත. නව යොවුන් වියේ දරුවකු තුළ ඇතිවන ප්‍රබෝධය හා ජවය අවදි කරන්නට, විවේක ගන්නට, ක්‍රීඩාවක නියැලෙන්නට, අන් අය සමග සබඳතා පවත්වන්නට දරුවාට වේලාවක් නැති තරමය. අනික් අතට ටියුෂන් පන්ති මුවාවෙන් විවිධ ආදර සම්බන්ධතා පවත්වාගෙන යාම මෙන්ම එහිදී ඇතිවන ගැටලු නිසා මිනීමැරුම් පවා සිදුවූ අවස්ථා මෑතකදී අපට අසන්නට ලැබිණි. එපමණක් නොව නූතන සමාජ මාධ්‍ය ජාල ඔස්සේ විභාගය පිළිබඳව අතිශය සෘණාත්මක ආකල්පයක් වර්ධනය කර ඇත. "ෆේල් වුණ නංගිලාව සනසනු ලැබේ, මල්ලිලා සමග දුකට බොනු ලැබේ" වැනි විවිධ ප්‍රකාශ සාමාන්‍ය පෙළ මෙන්ම උසස් පෙළ ප්‍රතිඵල නිකුත් වූ වහාම අපට සමාජ මාධ්‍ය තුළ දැකගත හැකියි. අප සමාජය හා වර්තමාන සංස්කෘතිය තුළින්ම එවන් ආකල්ප ගොඩනැගී ඇති බව කනගාටුවට කරුණකි. එපමණක් නොව ප්‍රතිඵලවල අසාර්ථකත්වය දරාගත නොහැකිව දිවි අහිමි කරගත් පුවත් ද අසන්නට ලැබීම තුළින් අප රටේ විභාග ක්‍රමය මගින් ශිෂ්‍යයා තුළ ඇතිකරන පීඩාකාරී මානසිකත්වය පැහැදිලි වේ.

සාමාන්‍ය පෙළ විභාගය තුළින් සැලකිය යුතු ශිෂ්‍ය පිරිසක් අධ්‍යාපනයට සමුදෙති. ඔවුන් ඊළඟට පිවිසෙන්නේ සමාජයටය. රැකියා වෙළඳපොළටය. සමාජය තුළ ඔවුන්ගේ අධ්‍යාපන මට්ටමට ගැලපෙන රැකියා නොමැති තරමය. රැකියාවක් තිබුණද එය අප සමාජය තුළ 'පිළිගත්' රැකියාවක් වන්නේ නැත.

අනික් අතට මත්කුඩු, මත්ද්‍රව්‍ය ඒ දරුවන් ගිලගැනීමට බලා සිටී. මෙමගින් අප සමාජ පද්ධතියට අහිමි වන්නේ කිසිදු හැකියාවක් නොමැති ශිෂ්‍ය පිරිසක් නොව නිර්මාණාත්මක හා කලාත්මක හැකියාවලින් හා යහපත් ගුණදම්වලින් පිරිපුන් පිරිසකි. ඔවුන් සතුව රටේ ප්‍රගමනයට දායාද කළ හැකි මහා විභව්‍යතාවක් පවතී. කෙසේ නමුත් අපගේ විධිමත් අධ්‍යාපන රාමුව තුළ ඔවුනට තිබූ ඉඩකඩ සාමාන්‍ය පෙළ ප්‍රතිඵලවලින් සීමා වෙයි. අනික් අතට සාමාන්‍ය පෙළ විභාගය සමත් වූ දරුදැරියන් මීළඟට අවතීර්ණ වන්නේ වඩාත් තීරණාත්මක උසස් පෙළ විභාගයටයි. ශාරීරික හා මානසික වශයෙන් යම් පරිණතභාවයකට ළඟා වන අවධියක උසස් පෙළ විභාගය ඔවුන් දකින්නේ තම ජීවිතයේ ඉරණම තීරණය කරන කඩයිමක් හැටියටය. කෙසේ නමුත් අප රටේ පවතින උසස් අධ්‍යාපන පහසුකම් සීමා වීම නිසා විශ්වවිද්‍යාල වරම් ලබන්නේ සීමිත ශිෂ්‍ය පිරිසක් පමණි. එයද තීරණය වන්නේ ඔවුන් උසස් පෙළ විභාගයේ දක්වන දක්ෂතාව අනුවයි. වසර දහතුනක් තිස්සේ තමා ඉගෙනගත් සබ්බ සකල මනාවම පැය පහක ප්‍රශ්න පත්‍රයකට සීමා වන අතර බහුතරයක් දරුවන්ගේ අධ්‍යාපනය එතැනින් නිමා වේ. අධ්‍යාපනයෙන් ජයගත්තවුන් සරසවි වරම් හිමිකරගෙන උසස් අධ්‍යාපනය තුළින් සාර්ථක වන අතර බහුතරයක් වෘත්තීය අධ්‍යාපනය හෝ වෙනත් ආකාරයකින් රැකියා වෙළඳපළට පිවිසෙන්නට මහත් වෙහෙසක් දරති.

මෙලෙස බැලූ විට අපගේ අධ්‍යාපනය හා විභාග ක්‍රමය මූලික වශයෙන්ම රැකියා වෙළඳපළ කේන්ද්‍ර කරගත් ක්‍රමයක් පමණක් බවත් දරුවන්ගේ නැණැස පමණක් නොව ආකල්ප කුසලතා වර්ධනය කරන ක්‍රමයක් නොවන බවත් අපට පෙනී යයි. සාමාන්‍ය පෙළ විභාගයෙන් අසමත් වන දරුවන්ටද අධ්‍යාපනයේ නිම්වළලු පුළුල් කරමින් හඳුන්වා **දුන් දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන ජාතික අධ්‍යාපනයට හඳුන්වා දී තිබුණද දහතුන් වසරකට පසු ශිෂ්‍යයාට කිනම් අනාගතයකට මුහුණ දෙන්නට වේද යන්න නිරන්තරයෙන් අප රටේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ මූලික විය යුතුය.**


අප රටේ සාම්ප්‍රදායික විභාග ක්‍රමයෙන් ජයගන්නේ ඉතා සීමිත පිරිසක් පමණි. විභාගය මූලික කරගත් අධ්‍යාපන රටාව තුළ ගුරුවරුන් පවා ශිෂ්‍යයා තුළ ධනාත්මක ආකල්ප, සදාචාරය, පෞරුෂය ආදිය සංවර්ධනය කිරීමේ වගකීමෙන් බැහැරව ගොස් ඇත. ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ආත්මාර්ථකාමී, සහකම්පනයෙන් තොරවූ තරගකාරී, යාන්ත්‍රික ශිෂ්‍ය පිරිසක් බිහිවී ඇත. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් වෙනුවට අද ගුරුවරයා පමණක් මූලික වන ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයක් බිහිවී ඇත. **තවදුරටත් විෂය කරුණු පමණක් ඉගැන්වීමෙන් පුද්ගල පෞරුෂය හෝ ආකල්ප සංවර්ධනයක් බලාපොරොත්තු විය නොහැකි බැවින් ප්‍රජානන ක්ෂේත්‍රය පමණක් නොව තාර්කික, භාෂාත්මක, නිර්මාණාත්මක, අවකාශමය හැකියා මෙන්ම ස්වයං විනය, යහපත් අන්තර්පුද්ගල සබඳතා, ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් පරිපූර්ණ දරු පිරිසක් නිර්මාණය කිරීම අධ්‍යාපනය තුළ මූලික විය යුතුය.** මෙය පාසල තුළ ශිෂ්‍යයාගේ හැම පියවරක් පසුපසම සිටින ගුරුවරයාගේ ප්‍රමුඛ කාර්යයක් වේ. කාලීන වෙනස්කම්වලට ගැලපෙන ලෙස පෙළපොත් වල විෂය මාලා වෙනස් වුවද විභාගය කේන්ද්‍ර කරගනිමින් ශිෂ්‍යයාගේ ප්‍රජානන ක්ෂේත්‍රය පමණක් වර්ධනය කරන ඉගැන්වුම් ක්‍රමවේදය තවමත් යාවත්කාලීන කිරීමට උත්සාහයක් දරන බව පෙනෙන්නට නැත.

කෙසේ නමුත් නූතන සමාජය තුළ සන්නිවේදනය හා තාක්ෂණය ප්‍රසාරණය වූ ලෝකයක දැනුම පුපුරා යන දැනුම් සමාජයක ගතානුගතික අධ්‍යාපන රටාවලින් හා පොතපත පමණක් ඉගැන්වීමේ රාමුවෙන් මිදී, ප්‍රායෝගිකත්වයෙන් යුතු ඉගෙනුම් ක්‍රියාවලියක් සකස් කිරීමෙහි ලා සමාජීය හා විශ්වීය වශයෙන් මහත් ඉල්ලුමක් පවතින බැවින් ඊට අනුකූලව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා අරමුණු සකස් විය යුතුමය. සමාජ අභියෝගවලට මුහුණදිය හැකි මනා පොරුෂයකින් හා වගකීමෙන් යුත් නිර්මාණාත්මක ශිෂ්‍ය පිරිසක් නිර්මාණය කිරීම අධ්‍යාපනයේ අරමුණ විය යුතුය.

සමාජීය හා සංස්කෘතික වශයෙන් අධ්‍යාපනය පිළිබඳ යහපත් ආකල්පයක් වර්ධනය කළ හැක්කේ, විභාගය අභාගයක් නොවන බවට පසක් කළ හැක්කේ අප රටේ පවතින තරගකාරී අධ්‍යාපන රටාව හා විභාග ක්‍රමය නිසි අයුරින් සංශෝධනයකට ලක් වුවහොත් පමණි. ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින රටක් ලෙස නොව අනාගත පරපුරට එය දියුණු වූ රටක් ලෙස දායාද කරන්නට පරිපූර්ණ අධ්‍යාපන ක්‍රමවේදයක් මනා පිටිවහලක් වන බව මගේ අදහසයි.

**ශාන් ප්‍රනාන්දු - කොළඹ විශ්ව විද්‍යාලය**

(ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය)



# සමබර අධ්‍යාපනයක් - පිරිපුන් පුරවැසියෙක්

"මම විභාගය කළේ උපරිමයෙන් මහන්සි වෙලා. මම හිටියෙ ලොකු පීඩනයකින්. නමුත් විභාගය ඉවර වුණා විතරයි, විවේකයක් ලැබුණෙ නැහැ. මට උසස් පෙළට පන්ති යන්න සිදුවුණා. මගේ මනසට ලොකු වෙහෙසක් දැනුණා. නමුත් කොරෝනා වසංගතය නිසා, පන්ති නතර වුණා. විවේකීව නිදහසේ ඉන්න කාලය ලැබුණ නිසා, යාන්තම් හිතට සහනයක් ලැබුණා."

පසුගිය දෙසැම්බර් සාමාන්‍ය පෙළ විභාගය ලියූ, ඉතා දක්ෂ දියණියක පැවසූ වදන් පෙළකි, මා ඉහත සඳහන් කළේ. විෂය බාහිර ක්‍රියාකාරකම්වලටද සහභාගි වූ ශිෂ්‍ය නායිකාවකද වෙමින්, අධ්‍යාපන කටයුතු ද සමබරව සිදුකර "A" සාමර්ථ්‍ය 7 ක් සහිතව සමත් වූ ඇයට අවශ්‍ය වූ, මානසික විවේකය ලබාගැනීමට හැකිවූයේ, කොවිඩ් 19 ට පින්සිදුවන්නට ය. ඉහත සිද්ධිය මා කම්පනයට පත් කළ අතර, අධ්‍යාපනය හා විභාග ගැන තවදුරටත් සිතන්නටද මඟ පෑදුවේය. දරුවන්ට, විභාග මෙතරම් බරක්, පීඩනයක් වන්නේ ඇයි? මෙය ගුරු දෙගුරුන්ද, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ නිලධාරීන්ද අවධානයට ගතයුතු වැදගත් කරුණකි.

සෝමලතා සුබසිංහ මහත්මියගේ 'විකෘති' නාට්‍යය මෙහිදී සිහිපත් වේ.

**"විභාගෙ විභාගේ එහෙ බැලුවත් විභාගේ, මෙහෙ බැලුවත් විභාගේ, විභාගෙ තමයි අපේ අභාගේ"**

මෙලෙස ඇරඹෙන ඒ නාට්‍යය, වසර ගණනාවකට පෙර නිෂ්පාදනයක් වුවද, එය අදටත් ගැලපේ. විභාග හා විෂය මාලාව ගැන අප සැම අවදි කරයි.

**ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන ක්‍රමය තුළ, යම් යම් ප්‍රබලතා මෙන්ම දුබලතාද ඇති බව පැහැදිලිය. විභාග අරමුණු කොටගත් අධ්‍යාපනය, තරගකාරීව දැනුම පමණක් හඹා යන ධාවන තරගයක තත්ත්වයකට පත්ව ඇති බව පිළිගත යුතුය.** සියලු දෙයම උගන්වමින් දැනුම පොවන, කටපාඩම් ක්‍රමයෙන් දැනුම ධාරණය කරවන, විභාගයෙන් එය වමාරන ක්‍රමයක් බවට පත්වී ඇති අධ්‍යාපනයකින්, වෙනස්වන ලෝකයට උචිත, සමබර පෞරුෂයකින් යුතු පුද්ගලයෙක් බිහි වේවිද?

ලොව හොඳම අධ්‍යාපන ක්‍රමය සහිත රට ලෙස සැලකෙන පින්ලන්තයේ, අසහනකාරී විභාග නැති 'ටියුෂන්' නැති පරිසරයට බෙහෙවින් ඇලුම් කරන එරට සිසුන්, ලොව අඩුම මානසික පීඩනයක් සහිත දරුවෝය. නෝර්වේ, ස්විඩනය වැනි රටවලද, උගත් දේ ඇසුරින් ගවේෂණාත්මකව, අත්දැකීම් ලබමින් ඉගෙනගැනීමට, සිසුන් පෙළඹවීම සිදුවේ.

**ලාංකික ගුරුවරයාගේද කාර්යභාරය විය යුත්තේ, ඉගැන්වීම පමණක් නොව, ඉගෙනගැනීමට මඟ සලසා දීමයි. විෂයානුබද්ධ ක්‍රියාකාරකම් හා පරිසරය ඇසුරින්, දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කර ගැනීමට සිසුන් යොමුකිරීම වඩා සාර්ථක බව මගේ අත්දැකීමයි.**

බොහෝ දෙමාපියන්, දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි විශාල අවධානයක් යොදන බව සත්‍යයකි. "දරුවනට හොඳ අධ්‍යාපනයක් දීම අනාගත ආයෝජනයකි", යන මතයෙහි පිහිටා තමන්ට නොහැකිවූ හෝ නොලැබුණු දෙයක්, දූ දරුවන්ට ලබාදීම තුළින්, තම සිහින සැබෑ කරගැනීමට, අසීමිත වෙහෙසක් දරති. දරුවන් කෙරෙහි, නොදැරිය හැකි බරක් පටවමින් ඉහළ සමාජ පන්තියකට දරුවා යැවීමට හැකි හොඳම මාර්ගය, විභාග සමත් කරවීම ලෙස සලකති. මෙසේ **විභාග අරබයා පීඩනයට ලක්කිරීමෙන් මල් කැකුළු වන් ජීවිත තළා පෙළා දැමීම වෙනුවට, අධ්‍යාපනයෙන් සිදුවිය යුත්තේ ඒවා විකසිත වීමට සැලැස්වීම නොවේද?**

"Examinations are a necessary evil" යනුවෙන් ඉංග්‍රීසි කියමනක් ඇත. "විභාග අත්‍යවශ්‍ය නපුරකි". විභාගය අත්‍යවශ්‍යය. ඉවත දැමිය නොහැකිය. එහෙත් අධ්‍යාපනයේ මූලික අරමුණ, 'විභාග තරගය' නොවන බව අපටම අමතක වී ඇතිසේ ය. සමාජයට වැඩදායී "පරිපූර්ණ මිනිසකු බිහිකිරීම" අධ්‍යාපනයේ අරමුණ විය යුතුය. (Wholistic Person) අධ්‍යාපනයේ උපයෝගීතාව පිළිබඳව, **දැනීම, කිරීම, පැවතීම, සමාජානුයෝගය** යන කරුණු 4 ක් යුනෙස්කෝ සංවිධානය මඟින් ඉදිරිපත් කර ඇත්තේ මේ අරමුණ සඳහාය.

අධ්‍යාපනයේ ප්‍රතිඵලය විය යුත්තේ **"මිනිස්කමින් ඉහළ ගිය මනුෂ්‍යයෙක්ද? නැතහොත් දැනුමින් පමණක් පිරුණු මොළයක් ද?" යන්න සිතා බැලීම වැදගත් ය. මොළය ඇති නමුත්, සංවේදී හදවතක් නැති පුද්ගලයන්ගෙන්, සමාජයට අවැඩක්**

**සිදුවීමටද ඉඩ ඇත.** මුදල් මංකොල්ල කෑම, ප්‍රතිකාර සඳහා පැමිණි රෝගියාව දූෂණය කිරීම වැනි තත්ත්වයට අද වෛද්‍යවරුන් පවා පත්ව තිබීම මීට සාක්ෂි වේ.

එසේ නම්, පරිපූර්ණ මිනිසකු බවට පත්වීමේ "ජීවිත විභාගය" සඳහා අවශ්‍ය වන්නේ, දැනුම පමණක් නොව, මනුෂ්‍ය සබඳතාද වැඩිදියුණු කරවන සමබර අධ්‍යාපනයකි. සාහිත්‍ය, සෞන්දර්යය, ඉතිහාසය වැනි විෂය ජීවිතය ජීවත් කරවීම සඳහා මහෝපකාරී වේ. එය දරුවාගේ පරිකල්පන ශක්තිය, වින්දන ශක්තිය දියුණු කරයි. **අධ්‍යාපනය තුළින් අධ්‍යාත්මය ගොඩනැඟීමද ඉතා වැදගත් ය. මේ සඳහා අති මහත් කාර්ය භාරයක් ඉටුකරන දහම් පාසල, ධර්මයෙන් පොහොසත්, උසස් පරමාර්ථ හා යහපත් ආකල්ප සහිත පුරවැසියකු බිහිකිරීමට දායක වේ. මෙය තවත් එක් 'ටියුෂන්' පන්තියක් ලෙස සලකමින්, ඉහළ ලකුණු හා සහතිකයක් අරමුණු කරගැනීම වරදකි. දේවස්ථානයේ ළමා සමිතියට හෝ නිවසේදී යාච්ඤාවකට කාලය වෙන් කිරීමද සාරධර්ම වර්ධනයට ඉවහල් වන නමුත්, අධ්‍යාපන තරගයම ඊට හරස් වී ඇත.**

අන් අය පරදා ඉහළට යාමේ මාර්ගයක් නොවිය යුතු අධ්‍යාපනයේ තරගකාරී බව, අද ඇරඹෙන්නේ පෙර පාසලෙන්මය. පළමු ශ්‍රේණියට ඇතුළත්වීමේ සම්මුඛ පරීක්ෂණයට දරුවා සූදානම් කිරීම සඳහාම ප්‍රශ්නෝත්තර සකස්කර, කටපාඩම් කරවන ළදරු පාසල්ද නැතුවා නොවේ.

මීළඟ කඩඉම 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වයයි. ළමා මනසට මහත් තපුරක් වන මෙය, තරග විභාගයකි. රාජකීය විදුහලේ පටන් ග්‍රාමීය දුප්පත් පාසල් සිසුන්ද ඉදිරිපත් වන මේ තරගයට, ඇත්තෙන්ම තරග වදින්නෝ දෙමාපියෝය. "අම්මලාගේ විභාගය" ලෙස මෙයට නමක් පටබැඳී ඇත්තේද මේ නිසාය. ගුරුවරු කෙසේ හෝ සිසුනට විෂය නිර්දේශය පොවා, ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු ලියවා, ශිෂ්‍යත්වය ජයගැනීමට හුරු කරවති. ඉහළම ලකුණු ලබාගැනීමේ ඒකායන පරමාර්ථයෙන්, පාසලේ අමතර පන්තියෙන්ද පසුව සමහරවිට එහිදී යමක් කවා, තවත්, 'ටියුෂන්' පන්තියකටද 'ඇදගෙන යාමට' දෙමාපියෝ උත්සුක වෙති.

"විභාගය එපා", "ශිෂ්‍යත්වය එක්ක මම තරහයි", "ශිෂ්‍යත්වය මට එපා වෙලා" ආදී කලකිරුණු අදහස් දක්වන සිසුන් මට හමුවී ඇත. **පළමු ශ්‍රේණියේ සිටම පන්ති යවමින්, දරුවාගේ කෙළිලොල් ළමා කාලය, ක්‍රීඩාවට, විනෝදයට තහංචි පණවා පොතපතටම සීමාකර ඇති දරුවාට විභාගය බරක් වී, විභාග භීතිකාවක් ඇතිවී තිබීම ගැන ගැඹුරින් සිතා බැලිය යුතුය.** ශිෂ්‍යත්ව විභාගයේ කඩයිම් ලකුණට වඩා, ලකුණු කීපයක් අඩුවීම නිසා, පාසලේදීම කම්මුල් පහරකින් තම දරුවාට ප්‍රතිචාර දැක්වූ මවක ගැන මට මෙහිදී සිහිපත් වේ. විභාගය ආසන්නයේ දී දරුවන් විවිධ රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේද, දෙමාපියන්ගේ පීඩනය නිසාය. විෂයානුබද්ධ ක්‍රියාකාරකම් හා පරිසරය තුළින්ද, විෂය කරුණු උගත හැකිව තිබියදී, පාසලේදී පමණක් නොව, අමතර පන්තියටද 'කොටුකර' අසුන්ගතව ඉගැන්වීම, සිසුනට ආතතියක් වීමෙන්, දෙමාපිය අපේක්ෂා ඉටුවේවිද?

ප්‍රාථමික අධ්‍යාපනයේ යහපත් අපේක්ෂාවෙන්, ශිෂ්‍යත්වය මූලිකවී විකෘත කර ඇත. අකුරක් ලියන්නට කියවන්නට නොහැකි සිසුන් පවා වසර 5ක් අවසානයේදී බිහිවන්නේ එබැවිනි. පසු පෙළට වැටුණු පසුබට සිසුවා අනාථ වන්නේද, ශිෂ්‍යත්ව විභාගය නිසාය.

ද්විතීය අධ්‍යාපනයේ සන්ධිස්ථානය වන අ.පො.ස. (සා./පෙ.) විභාගය, සිසුනට තම දක්ෂතා හඳුනාගෙන, උසස් අධ්‍යාපනයට පිවිසීමට කඩඉමක් විය යුතුය. විෂය 9 කට, දරාගත නොහැකි විෂය කරුණු ප්‍රමාණයක් හැදෑරිය යුතුය. සිසුන්ගේ බුද්ධි මට්ටම් එක හා සමාන නොවේ. හෙමින් ඉගෙනගන්නා සිසුනට ගණිතය විද්‍යාව වැනි විෂය විශාල පීඩනයකි. එවැනි විෂයකට "S" සාමර්ථ්‍යයකින් වුවද සෑහීමට පත්වෙමින්, උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් සපුරාලීම ප්‍රමාණවත් ය. A - 9 ඉලක්කය සඳහා සියලු විෂයවලට උපකාරක පන්ති 2 ගණනේ පවා යැවීමට දෙමාපියෝ පෙළඹෙති. දරුවාගේ ලැදියා, විභව්‍යතා දෙවෙනි තැනට වැටේ. **අවසානයේ බිහිවනුයේ, සොබාදහමේ අසිරිය නොහඳුනන, පවුලේ එකමුතු චාරිකාවක් වුවද මගහරින, සමාජ සබඳතා දුර්වල දරුවන් ය. පොතටම සීමාවීමෙන් සෞන්දර්යාත්මක රසවින්දනයට කාලය ඇහිරිලාය.** පාසලේ තූර්ය වාදන පුහුණුව වෙනුවෙන් විද්‍යාව විෂය මග හැරීම නිසා, මා විසින් අවවාද කරනු ලැබූ, සංගීතයට ලැදිවූ එක් ශිෂ්‍යාවක් අද සංගීත

23 වන පිටුවට.....

බී. රූබි රුද්‍රිගු
විශ්‍රාමික විදුහල්පතිනිය
හපුගොඩ

# අධ්‍යාපනයේ මිථ්‍යාව හා සත්‍යය

## නිදහස් අධ්‍යාපනය

නිදහස් අධ්‍යාපනය ලෙස හැඳින්වෙන්නේ නොමිලේ ලබාදෙන අධ්‍යාපනයයි. නෛතිකව ලංකාව යනු 14 වසරක නිදහස් අධ්‍යාපනයක් අනිවාර්ය රටකි. ඉන් පසු රාජ්‍ය විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද නිදහස් රටකි. එහෙත්, ඇත්ත ඊට වෙනස්ය. ප්‍රායෝගිකව ලංකාවේ ළමයින්ගෙන් විශාල ප්‍රතිශතයක් ටියුෂන් යති. පාසල් පද්ධතිය තුළ විවිධාකාර ගෙවීම් කිරීමට සිදු වේ. පාසලට ඇතුළු කරගැනීමේදී අන්තිම දුප්පත් ග්‍රාමීය පාසල්වල සිට ඉහළම පෞද්ගලික ජාතික ජාත්‍යන්තර පාසල දක්වා විවිධ ප්‍රමාණයෙන් මුදල් අය වේ. ඒ මුදල රු. 1000 සිට රු. 1500000 - 2000000 දක්වා විශාලය. අධ්‍යාපනයේ මුල්ම පියවර වන පෙර පාසල් අධ්‍යාපනය සම්පූර්ණයෙන් නොනිදහස් අධ්‍යාපනයකි. වසර දෙකක පෙර පාසල් සමය සඳහා ඇතුළුවීම් ගාස්තු රු. 5000-500000 දක්වා පරාසයක පවතී. රජයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයකුට විශ්ව විද්‍යාලයට ගාස්තු නොගෙවුණද අධ්‍යයන වසර තුන හතර තුළ අවම වශයෙන් රුපියල් ලක්ෂ තුන හතරක් වැය වේ.

ටියුෂන් ගත් කළ සමහර විට පවුලක ආදායමෙන් 40% පමණ වේ. ලංකාවේ 60% කගේ අවම මාසික වැටුප 15,000 - 20,000 අතරය. දරුවන් දෙදෙනෙකු ටියුෂන් තුනකට බැගින් ටියුෂන් ගියහොත් අවම ටියුෂන් ගාස්තුව රු. 6000 කි. උසස් පෙළදී නම් අවම ගාස්තුව විෂය තුනකට රු. 6000 කි. **රජය වසරකට අධ්‍යාපනය සඳහා වැය කරන මුදලට වඩා වැඩි මුදලක් රටේ මහජනයා වසරකට වැය කරති. ඉතිං නිදහස් අධ්‍යාපනය මිථ්‍යාවකි. හැබැයි ඉන් අදහස් කරන්නේ නිදහස් අධ්‍යාපනය අහෝසි කළ යුතු බව නොවේ. එය ඇත්ත නිදහස් අධ්‍යාපනයක් ලෙස පිහිටවිය යුතු බවයි.**

## සම අධ්‍යාපනය

රටේ සියලු දරුවන්ට සමාන ප්‍රශ්න පත්තර රජයේ විභාගවලදී ලැබේ. එසේ ලබාදෙන්නේ රටේ සියලු දරුවන්ට සම අධ්‍යාපනයක් ලබා දෙන බව පිළිගැනෙන නිසාය. එය මිථ්‍යාවකි. සත්‍යය වන්නේ රටේ ඇත්තේ විෂම අධ්‍යාපනයක් බවයි. **වසර ගණන් ඇතැම් විෂයවලට ගුරුවරුන් නැති පාසල්වල දරුවන්ද, ඉහළම පහසුකම් හොඳම ගුරුවරු හා හොඳම ටියුෂන් ලැබෙන (පෞද්ගලිකවම ගෙදරට ගෙනත් ඉගෙනීම ලබන) දරුවාද මුහුණ දෙන්නේ එක ප්‍රශ්න පත්තරයකටය. මෙය අතිශය විෂම අධ්‍යාපනයකි.**

වසර 30 පුරා පත්වූ හැම අධ්‍යාපන ඇමතිවරයාම වතුර නැති, වැසිකිළි නැති පාසල් 800-1000 ක් තිබෙන බව පැවසුවද විසඳුම් දී නැත. ඒ ප්‍රමාණය හැම පාසල් 10 කට එකකි. ඒවායේ අධ්‍යාපනය ලබන්නේ රටේ අති දුප්පත් දරුවෝය. මේ විෂමතාවට යම් සැලකීමක් කරන්නේ විශ්ව විද්‍යාල ප්‍රවේශයේදී පමණි. එහෙත් ඒ ක්‍රමවේදයද දශක ගණනකින් සමාලෝචනය කර නැති අතර බරපතළ ගැටලු තිබේ.

## විශ්ව විද්‍යාල හැරයාම

රටේ බොහෝ දෙනා දන්නා ප්‍රශ්නය පාසල් හැර යාමයි. ඇත්තෙන්ම, ඊටත් වඩා බරපතළ ප්‍රශ්නයක් බවට විශ්ව විද්‍යාල හැරයාම පත්ව තිබේ. එහෙත් විකල්ප ගැන කතා කරන්නන් පවා ඒ ගැන අවදියෙන් නැත. වසරකට විශ්ව විද්‍යාලයට බඳවා ගන්නා 22000 - 25000 ක් අතර ප්‍රමාණයෙන් 5% - 10% ක් විශ්ව විද්‍යාල අධ්‍යාපනය හැර යන තත්ත්වයක් පවතින බව බැලූ බැල්මට පෙනේ. මේ සා දුර පැමිණි අයත් ඒ අධ්‍යාපනය අත්හරින්නේ ඇයි ? ප්‍රධාන කොට ආර්ථික ගැටලුය. දෙවැනිව ඉංග්‍රීසි පිළිබඳ ගැටලුය. තෙවැනිව පද්ධතියේ ඇති ගැටලුය.

## අසමත් අධ්‍යාපනය

උගන්වන්නේ මොනවාද? ප්‍රධාන තර්කය රැකියා වෙළඳපොළට සරිලන අධ්‍යාපනයක් නැති බවය. ඊට සරිලන වෙනස්කම් ගැන යම් යම් ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙනුලැබේ. වත්මන් ජනපතිවරයාද ප්‍රසිද්ධියේ දරුවකුට පැවසුවේ මානව ශාස්ත්‍ර අධ්‍යාපනය පලක් නැති බවය. තාක්ෂණ අධ්‍යාපනය ලැබිය යුතු බවය. ප්‍රශ්නය රැකියා වෙළඳපොළට සරිලන අධ්‍යාපනයක් නැතිකම පමණක් නොවේ. අධ්‍යාපනයේ අරමුණ රැකියාවක් නම් ඉතා දුප්පත් අදහසකි.

**හැම පාසලකම ලොකුවට ලියා ඇති දැක්ම, යහපත් පුරවැසියන් බිහි කිරීම වුවද සිදු නොවන්නේ එය බවට විවාදයක් නැත. ඉගැන්විය යුත්තේ මොනවාද? උගන්වන්නේ කෙසේද? යන ප්‍රශ්න ගැන ඉතිහාසය පුරා ඇත්තේ අඳුරේ අතපත ගෑමකි.**

## ගුරුවරු අතුරුදහන්වීම

දෙවිකම ළඟට ගුරුකම යනු රුවන් වැකියකි. ගුරුවරයා උත්තම පුරුෂයකු යැයිද කියැවේ. වෙළඳපොළ ධනවාදය තුළ දිනෙන් දින දෙවිවරු වන් ගුරුවරු අතුරුදහන් වෙති. රජයෙන් දරුවන්ට ඉගැන්වීමට වැටුපක් ලබන ගුරුවරයා පාසලේ තම පන්තියේම ඉගෙන ගන්නා සිසුවාට හවසට මුදල් අයකර උගන්වනවා නම් එතැන මිනිසෙක් නැත, ගුරුවරයෙක් නැත. එවන් ගුරුවරුන් දින දින වැඩිවන අධ්‍යාපන පද්ධතිය තුළින් මිනිසුන් බිහි නොවේ. පාසල් ගුරුවරුන්ගේ ප්‍රශ්නය ආර්ථික ක්‍රමයේ සමාජ ක්‍රමයේ අවශ්‍යතාවලට සරිලන වැටුපක් නොමැතිකමය. ඒවාට විසඳුම් නොදෙන අර්ථ ක්‍රමය තුළ ගුරුවරු අතුරුදහන් වෙති. ගුරු ගෞරවයද අතුරුදහන් වේ. අධ්‍යාපනයේ අරමුණු අතුරුදහන් වේ. එහෙත් වැටුප් ප්‍රමාණවත් නොවීමේ ප්‍රශ්නය බොහෝ ක්ෂේත්‍රවල පවතින බව අමතක නොකළ යුතුය. විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ලිංගික අල්ලස් ගන්නා ගුරුවරුන් ගැන අසන්නට ලැබේ. පළමු උපාධියට, ශාස්ත්‍රපති උපාධියට, අධ්‍යාපනවේදි උපාධියට අදාළ නිබන්ධන මුදලට ලියාදෙන ගුරුවරුන් බිහි ව තිබේ. උසස්පෙළින් සරසවියට යාමට විශ්ව විද්‍යාලය පවත්වන අතිරේක විභාගවලට දහස් ගණන් අය කර පන්ති පවත්වන ගුරුවරුන් ද බිහිව තිබේ. පෙර පාසලේ සිට විශ්ව විද්‍යාලය තෙක්ම සැබෑ ගුරුවරුන් හිඟවෙමින් පවතින විට අධ්‍යාපනයේ හෙට දවස අඳුරින් අඳුරටය.

## අධ්‍යාපනය අපරාධයක් නොවන්නට

උසස් අධ්‍යාපන ආයතනයකට නොගිය ජේසුස් වහන්සේ, අකුරු ලිවීමට නොදන සිටි මොහොමඩ් නබි සතු වූ ප්‍රඥාවේ මාවත වැටී ඇත්තේ හුදෙක් පාසල් අධ්‍යාපනය තුළ නොවන බව තේරුම් ගත යුතුය. දැනුමෙන් ප්‍රඥාවට යන අධ්‍යාපනයක්, මුදල වෙනුවට ප්‍රේමය මුල්කරගත් අධ්‍යාපනයක් සඳහා පවතින ක්‍රමයේ වෙනසක් ඇවැසිය. බුදුන් වහන්සේ ලබාදුන්නේ එදා පැවැති සමාජ ආර්ථික දේශපාලන ක්‍රමයකට විරුද්ධ අධ්‍යාපනයකි. ජේසුස් වහන්සේ ලබා දුන්නේද, මොහොමඩ් නබි ලබාදුන්නේද එවැනි ක්‍රම විරෝධි අධ්‍යාපනයකි. (අධ්‍යාපනය තුළින් විධිමත් දැනුමක් ලැබෙයි. මෙයින් අදහස් කරන්නේ, ක්‍රිස්තුන් වහන්සේ සහ බුදුන් වහන්සේ එකල පැවැති විවිධ සමාජ අක්‍රමිතා සහ ජනතාව පෙළන දැවලට විරුද්ධව දැනුම් සම්භාරයක් හරහා ජනතාව දැනුවත් කළ සේක. මොහොමඩ් නබි තුමාද පවතින ක්‍රමයට විරුද්ධ දැනුම තුළින් ජනතාව මෙහෙය විය.) ධනය බලය නිලය වෙනුවට ප්‍රේමය මෛත්‍රිය බෙදා ගැනීම සමානාත්මතාව පරිසරය සුරැකීමට අදාල අධ්‍යාපනයකි. පවතින ක්‍රමයට පක්ෂ අධ්‍යාපනය යනු පෘථිවි විරෝධි, ජීව විරෝධි මානව විරෝධි අපරාධකාර අධ්‍යාපනයකි. එය පැලැස්තරවලින් විසඳිය නොහැකිය. පැලැස්තර සමඟ දූන් පරම්පරා ගණනාවක් අවසන් වී ඇත. අර්බුදය මෝරමින් තිබේ.

## විසඳුම් තිබේ

මේ ලියුවේ අල්පයකි. ලැබෙන සීමිත ඉඩකඩ නිසාය. ඇත්තේ අර්බුදයකි. විස්තීර්ණ අර්බුදයකි. විසඳුම් ඇත. එය සමස්ත වෙනසක් තුළ සිදු විය යුතුය. පවතින තත්ත්වය තුළ ද ගත හැකි විසඳුම් ඇත. ඒවා යෝජනා කර ඇත. ක්‍රියාත්මක කරන්නේ නැත්තේ කවුද? දේශපාලකයන්ය, ප්‍රභූන්ය, උගතුන්ය, වියතුන්ය, උසස් පාසල්වල සිටින මාෆියා ආදී ශිෂ්‍ය සංගම්ය, ජාතිවාදීන්ය, ආගම්වාදීන්ය.

උතුරෙත් දකුණෙත් රුධිර ගංගා ගලා ගිය අරගල තුළ අධ්‍යාපන අර්බුදයද එක් ප්‍රධාන හේතුවක් වූ බව ප්‍රතිපත්ති සම්පාදකයන්ට අමතකය. **ලෝකයේ ඉතා හොඳ අධ්‍යාපනයක් ඇති රටක් වන්නේ පින්ලන්තයයි. ඒ රටේ ඉහළම වැටුප හා පිළිගැනීම ඇති වෘත්තිය ගුරුවෘත්තියයි. ගුරු වෘත්තියට ඇතුළත්වීම් ලංකාවේ විශ්ව විද්‍යාලයකට ඇතුළුවීමට වඩා දුෂ්කරය. අයදුම්පත්වලින් 60% ක්ම ප්‍රතික්ෂේප වේ. විභාග ආතතියක් ළමයින්ට නැත. පන්තිකාමරය නම් හතරැස් කොටුවෙන් එපිට අත්දැකීමෙන් ඉගැන්වීම නිසා පාසල මිහිරිම තැන වී ඇත.**

**මහින්ද නාමල්**

# ශිෂ්‍යත්වය

අම්මලාව නැවතත් පන්ති කාමරයක අසුන් ගන්වන පහේ ශිෂ්‍යත්වය දූන් දූන් බොහොමයක් වූ දරුවනට මානසික පීඩාවක් වී හමාරය.

'විභාගය අපේ අභාගය' යැයි සිතන තරමට දරුවනට ශිෂ්‍යත්වය යන කඩඉම සිතට මනසට වදයක්. කරදරයක් වන තරමටම අම්මලා තම දූ දරුවන්ට 'ශිෂ්‍යත්වය කියන අකුරු පහ පමණට වඩා තිත්ත කසාය බඳුනකට සමානකර ඇති බව කනගාටුවෙන් වුවද කිවයුතු වේ. ''අම්මලා'' යන වචනය මෙතැනට භාවිතය වූයේ සාමාන්‍යයක් ලෙස ගත් කළ බොහෝවිට දරුවන් පසුපස ශිෂ්‍යත්ව සටන සඳහා පුරෝගාමී වන්නේ තාත්තලාට වඩා අම්මලා නිසාය.

ඉතිං එය වරදක් ද?

'නැහැ.... අප එලෙස නොකියමු....' නමුත් 'ඕනෑම දෙයක් ඕනෑවට වඩා ඕනෑම නැත' යන න්‍යායයෙහි සිට බලන විට නම් අම්මලා දරුවන් පසුපස කෙවිටක් රැගෙන ශිෂ්‍යත්වය සඳහා කරන උසිගැන්වීම බොහෝවිට 'උමතුවකි'.

**පහේ ශිෂ්‍යත්වය යනු කුමක්ද?**

'සාමාන්‍යයෙන් එයට දෙන්නට හැකි සරලම උත්තරය මෙයය....'

එනම් මෙය දූ දරුවන්ගේ දැනුම උරගා **බලන සරල පරීක්ෂණ ක්‍රමයකි. එලෙසම ශිෂ්‍යත්වය සමත් වූ දරුවා අති දක්ෂයකු ලෙසත් අසමත් වූ දරුවා කිසිවක් නොදන්නා අදක්ෂයකු ලෙසත් කෙලෙසකවත් තීරණය කරන්නට නොහැකිය.** එයට සරලම නිදසුනක් ලෙස, ශිෂ්‍යත්වය සමත් වූ බොහෝ දරුවන් සාමාන්‍ය පෙළ අසමත් වන අවස්ථා සේම ශිෂ්‍යත්වයට ඉතාම අඩුවට ලකුණු ගත් දරුවන් සාමාන්‍ය පෙළ සමත්වන අවස්ථා බොහෝවිට දකින්නට තිබෙන බව පෙන්වා දිය හැකිය.

**අම්මලා පහේ ශිෂ්‍යත්වය හමුවේ දරුවන් පීඩනයට පත් කිරීම සාධාරණ ද?**

එය මෙලෙස පහදන්නට පුළුවනි.

හැම අම්මා සහ තාත්තා කෙනකුගේම සිහිනය දරුවා උගතකු කරවීමයි. අන්න ඒ නිසා තමයි හැම තැනකම වාගේ මාපියන් දරුවන්ට දරා ගන්නට බැරි මට්ටමේ බරක් හිස මත පටවා 'පුළුවන් තරම් හයියෙන් අන්න අර කන්ද නගින්න පුතේ....' කියා විශාල මෙහෙවරක අනුරුවක් දරුවන්ගේ මනසෙහි මවා ඒ පාමුලට වී වෙලා සිටින්නේ.

ශිෂ්‍යත්වය කියන්නේ එහි එක් කඩඉමකි. හැබැයි පහේ ශිෂ්‍යත්වය සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළට සමකරන්නට බැහැ. එයට හේතුව සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළට අසුන් ගන්නා දරුවකුට වඩා ශිෂ්‍යත්වය සඳහා අසුන් ගන්නා දරුවාගේ මානසිකත්වය වෙනස්. **පහේ පන්තියේ ඉන්න දරුවා පරිණතභාවයෙන් මාපියන් හිතන තරමට අංග සම්පූර්ණ නැහැ. පහේ පංතියේ ඉන්නේ බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ඇල්ම තිබෙන යටි හිතක් සහ මානසික තත්ත්වයක් තියෙන දරුවෙක්ය.**

අනික 3, 4, 5 යන ශ්‍රේණි තුළ තමයි දරුවකුගේ මොළයේ ක්‍රියාකාරිත්වය වඩා වර්ධනය වන කාලසීමාව පැමිණෙන්නේ, එතැන දී දරුවනට බාහිර ක්‍රියාකාරකම්වල ඇසුර අවැසි වෙනවා. මෙහිදී **ක්‍රීඩාව, සංගීතය, පරිසරය හා ගැටීම, තමාට ආවේණික සහජ හැකියා වර්ධනය කර ගැනීමට අවශ්‍ය නිදහස යන ඉසවු සමඟ දරුවා විශේෂයෙන් කාලය ගෙවිය යුතුමයි.**

එහෙත් සිදුවන්නේ, එය නෙමෙයි.

තුන්වෙනි පන්තියේ සිටම අම්මලා කරන්නේ දරුවාට 'ශිෂ්‍යත්ව' විභාගය කටු ඔටුන්නක් කරවීමය. උදේ සිට දහවලෙහි අධ්‍යාපන කටයුතු නිමවා එන දරුවාට එයට පසු ටියුෂන්, හවසට 'හෝම් වර්ක්', නිවාඩු දවසට පාඩම්... කෝ ඉතිං දරුවාට අර ඉහත කී බාහිර ක්‍රියාකාරකම්වල නියැලෙන්නට කාලයක්? **මොහොතකට නැවතී හිතලා බලනවා නම් ළමා මානසිකත්වයට අනුව මෙය අපරාධයකි.**

අම්මලා සුපිරි පාසලක සිහිනය දකිනවා.... ඒ වෙනුවෙන් දරුවාව ශිෂ්‍යත්වය කරා උසිගන්වනවා, නමුත් අනේ, **නොදරුවාගේ සිහිනය ළමා විය තුළ නිදහසේ රජකිරීමයි. එතැන පැති දෙකක්.... බොහෝවිට ජය ගන්නේ අම්මලගේ පැත්තයි....** හැබැයි සමහර තැනක අම්මලාගේ හීනය ඉටුවන තරමට දරුවන්ට ලකුණු නැහැ. ශිෂ්‍යත්වයත් 'ෆේල්' දරුවා සතු ළමා කාලයෙන් කොටසකුත් ඒ එක්ක ගෙවිලා ගිහිං.

ඊළඟට ඇරඹෙන්නේ වෙනත් දරුවකුගේ **දක්ෂතාව අගයමින් දරුවාට නිතර පහර ගැසීමයි. සත්තකින්ම කියනවා නම් මෙය අසාධාරණය, අම්මලා මෙය තේරුම් ගත යුතුයි.**

පහේ ශිෂ්‍යත්වය සඳහා දරුවා යොමු කරවීම නරක නැහැ....

සුපිරි පාසලක වරප්‍රසාදයට අත පෙවීම ද අසාධාරණ නැහැ....

නමුත් ආදරණීය අම්මේ, තාත්තේ, අමතක නොකළ යුතු යමක් වේ....

ඒ ඔබට දිනන්නට අවැසි ඉසව්වකට දරුවන් යොමු කරවීමේදී **ඔවුන්ගේ මානසිකත්වය සහ ඔවුනට අයිති විය යුතු නිදහස ගැන දෙවරක් සිතන්න. බොහෝවිට ඒ සිතුවිල්ල හොඳ පෞරුෂයකින් හෙබි දරුවකු ලොවට දායාද කිරීමට අවැසි සොඳුරු ප්‍රතිපාදන ඔබට නොමිලේම සපයා දෙනු ඇත.**

උපදෙස් :
**විශේෂඥ මනෝ වෛද්‍ය රූමී රූබෙන්**
(ශික්ෂණ රෝහල කරාපිටිය)
සටහන : **දමයන්ති ප්‍රනාන්දු**

covid-19.... 7 වන පිටුවෙන්.....

අන් අයට උපකාර කිරීමට නැඹුරුවක් දක්වන පරාර්ථකාමී මිනිසුන් තවමත් අපේ රටේ ජීවත් වන නිසයි. මෙහි දී තවත් යමක් සඳහන් කරනු කැමැත්තෙමි. එක් අවස්ථාවක අප රටේ යුද්ධයෙන් පීඩාවට පත් දරුවන් සමූහයකගේ අනුවර්තන හා අක්‍රමිකතා වර්ධනය පිළිබඳ අධ්‍යයනයක් සිදුවිය. මෙහි දී පෙනී ගියේ බොහෝ අනාථ දරුවන් යුද්ධයට නිරාවරණය වීමෙන් පසු ඊට ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කරන බවයි. ඒ සඳහා ඔවුන්ගේ ඇදහිල්ල, පෞද්ගලික යහපැවැත්ම සහ අයිතිවාසිකම් පිළිබඳ හැඟීම වර්ධනය කිරීම සඳහා තිබූ ආගමික වත්පිළිවෙත් බෙහෙවින් ප්‍රයෝජනවත් වී තිබුණි. වර්තමාන වසංගතයට ද මෙකී ඔරොත්තු දීමේ හැකියාව ජනතාව තුළ වර්ධනය කිරීමෙහිලා බොහෝ අංශවලට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ හැකි බව මෙයින් පෙනී යයි. මේ තීරණාත්මක යුගයේදීවත් දේශපාලනික, ආර්ථික හා ආගමික පටු අරමුණු නොසලකා පොදු යහපත වෙනුවෙන් එක්ව, එකාමෙන් කටයුතු නොකළ හොත් රටේ නුදුරු අනාගතය ම තීරණාත්මක යුගයකට අවතීර්ණ වෙනවා නොඅනුමානය.

## කලාපයෙන් කලාපයට භක්තියෙන් ප්‍රබෝධනයට ලියන චුට්ටා

# චූටිකමට කියන කතා....

විභාගය භාග්‍යයක්ය. ඒත් අපේ විභාග අභාග්‍යයක්මය. ඒ කිව්වේ සමහරු විභාගය සමත් උනත්, රැකියා නැත. සමහරු විභාග අසමත් උනත්, දේශපාලන දොර ඇරේ. මැති ඇමතිකම් ලැබේ. ඔවුන්ට ආචාර්ය උපාධිය වුණත් මිලදී ගත හැකිය. විභාග නැතුව ඔවුහු පාර්ලිමේන්තුවේ පිනුම් ගසති.

අපේ ශිෂ්‍යත්වය අම්මලාගේය. සාමාන්‍ය පෙළ ගුරුවරුන්ගේය. උසස් පෙළ ටියුෂන් ගුරුවරුන්ගේය. එතකොට, අපේ ළමයින්ට කියල විභාගයක් ඇත්තේම නැද්ද? එකනේ මේකට පුදුම ලන්තය කියන්නේ..... මං චුට්ටා....

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා**

# ටීචර්ට ලියුමක්

ටීචර්ට,

අකුරු හරි හැටි ගලපන්න බැරි කමට වරදක් ඇතොත් ලියුමේ
තරහ නොගෙනම කියවන්න, මේ කඳුළු බර ජීවිතේ අරුමේ
පොඩි එකා ඉස්කෝලෙ යන්නට බැහැ කියන එක තමයි කරුමේ
අනේ නෝනේ මක් කරන්නද දුකම විතරයි අපේ උරුමේ,

අනුන්ගේ කුණු ඉඳුල් දැලි හැලි වළඳ සෝදා ගන්න සොච්චම
ඉවරයිනෙ එක වේල කන්නට හාල් තුනපහ ටිකක් ගත්තම
සභාවේ කුණු ඇද්ද පුතුගේ අප්පච්චිගේ සොහොන දැක්කම
යන්න හිතෙනව එයා ළඟටම ඉවසන්නෙ දරු පැටිය හින්දම,

පොතක් පෑනක් අරන් දෙන්නට ඕන කම මගෙ හිතේ තිබුණා
ඉල්ල ඉල්ලා වද නොකර අඩුපාඩු ඉවසන් පුතා හැදුණා
කහට උගුරක් දෙකක් බීලා ඉස්කෝලෙ සතුටින්ම රැඳුණා
පොඩි එකාගේ කඳුළු එක්කම හීන ඔක්කොම මගේ බිඳුණා,

එක පොතේ සිංහලත් ඉංගිරිසියත් ගණනුත් හදා තිබුණලු
පොතේ අග පිටුවේම දෙමළත් අකුරු තුන හතරක්ම ලිව්වලු
පැන්සලෙන් ලිවූ රචනාව උඩ පන්සලක චිත්‍රයක් ඇන්දලු
පොත අරගෙනම එන්න කිව්වම අනේ උගේ අත පයත් ගැහුණලු,

අපිත් කන්නේ එකම වේලයි, ඒත් නෑ අද අතින් කෑවේ
අතේ අල්ලත් ඇඟිලි දෙකකුත් පුපුරලා මම බෙහෙත් ගෑවේ
පුංචි ඇඟ පත රිදෙනවා ඇති නින්දෙනුත් දැන් කෙඳිරි ගෑවේ
පිටේ වේවැල් පාරවල් තුන හතර දැක්කම පපුව දෑවේ,

පය තියන හැම තැනම ගින්දර පිච්චෙනව අපි දවස ගානේ
අපි කඳුළු හැංගුවා අපිටම හිනා වුණ දවසකුත් නෑනේ
දුක විඳල මට හොඳට පුරුදුයි කොල්ලටයි සැනසුමක් ඕනේ
ඉගෙන ගත්තත් නැතත් දරුවට ගහන්නට නම් එපා නෝනේ

\- **අම්මා** -

ඉහත දැක්වූ, ඕනෑම අයකුගේ ඇසට කඳුලක් උපදවන ඉතාම සංවේදී ඒ කවි පන්තිය ගැන මෙය කියවන ඔබට නිච්චියක් ඇත්දැයි යන්න මම නොදනිමි.

ප්‍රවීණ මාධ්‍යවේදී මහේෂ් නිශ්ශංක ඉතා කදිමට මෙහෙයවන '**සිහිනයකි රෑ**' විශේෂාංගය ඔබ නොකඩවා නැරඹුයේ නම් ඒ කවි පද පෙළ ඔබගේ මතකයට එනු ඇත.

'ටීචර්ට ලියුමක්' යනුවෙන් තේමා ගත වූ ඒ දුක හිතෙන කවි පංතිය ලියා තිබුණෙත් අම්මා කෙනෙකි.... **ඇ නමට පමණක් අම්මා නොවූ ඉතාම සෙනෙහබර අම්මා කෙනෙකි.**

එහි කතා පුවත කෙටියෙන් මෙලෙස සඳහන් කරමි. ගුරුවරියක වෙතින් දඬුවම් ලැබූ තම කුඩා පුතුගේ හිත් වේදනාව වෙනුවෙන් දැඩිව සංවේදී වූ අම්මා කෙනකු, ඉකුත් දා තම පුතු වෙනුවෙන් ටීචර්ට ලියුමක් ලිව්වාය. එයට පසු දිනෙක 2018-12 මස 30 වැනිදා '**සිහිනයකි රෑ**' ප්‍රේක්ෂකාගාරයට පැමිණි සිටි ඒ අම්මාට තම වේදනාවේ හඬ අවදි කරන්නට ඉඩ ලැබෙන්නේ මහේශ් නිශ්ශංක නම් වූ සොඳුරු මාධ්‍යවේදියාගේ අනපේක්ෂිත ආරාධනාව මතය.

එතැන් සිට හිතක් පපුවක් ඇති සැම මෙන්ම සංවේදී නොවූ සිත් ඇත්තන් ද ඉහත කී අම්මා ටීචර්ට ලියූ ලියුමෙහි දුක හිතෙන හැඟීම් බෙදා හදාගෙන ගන්නා ආකාරය මම පසකට වී බලා සිටියෙමි.

කවියට පසුබිම්ව තිබුණේ තම පුතුට ටීචර් දුන් දඬුවම නිසා අම්මාට දැනුණු සන්තාපයේ කඳුළය.

මගේ ගුරු සිත ද මේ මොහොතේ සැණෙකින් අතීතයට දිව ගියේ ය. ඒ කතන්දරය තුළ සිටියේ එවකට දෙවන වසරෙහි ඉගෙනුම ලැබූ මගේ පුංචි පුතා සහ මමය.

කම්පියුටර් පාඩමට නියමිත පොත ගෙන යාමට අමතක වූ වරදට මගේ පුතාට ද ටීචර් දඬුවමක් දී තිබූ ආකාරයත් එහි සිත් තැවුල විඳ දරා ගැනීමට අපොහොසත්ව පුතු ශෝකයට පත්ව හඬා වැටුණු ආකාරයත් මට සිහිවිය. එදින ඒ මොහොතේම මම පුතුට වරද වටහා දී ඔහු සිත සැනසුවෙමි. ගැටලුව එතැනින් විසඳුණේ නැත. එදාට පසු පරිගණක විෂය තියන හැම දිනකම පාහේ පුතා පාසැල් යාමට අදිමදි කළේය.

පසුව සියල්ල සමථයකට පත්වූයේ මම පුතුගේ ගුරුවරිය හමුවී සුහද කතාබහක නියැලුණාට පසුවය. කාරුණික ඒ ටීචර් පුතු ගැන දුක් වූ අයුරුත් පුතුට හොඳින් ආදරය කළ අයුරුත් එතැන් සිට පුතුගේ පාසැල් ගමන ප්‍රබෝධවත්ව සිදු වූ අයුරුත් මට අද මෙන් මතකය.

ඉතිං 'භක්ති ප්‍රබෝධනය' සඟරාවට පසුවදනක් කරමින් ටීචර්ගේ ලියුම පසුබිම කරගෙන මම මගේ සටහන තව දුරටත් මෙලෙස අකුරු කරන්නට පැන මෙහෙයවමි.

කුමන තත්ත්වයකදී වුවත්, ගුරුවරුන් ලෙස අප දරුවන්ට ආදරය කළ යුතුය. ඔවුන් සුරක්ෂිත කළ යුතුය. දැනුමෙන්, ආකල්පවලින් හා කුසලතාවලින් පෝෂණය කළ යුතුය. හිස පිරුණු, හදවත තෙක් සවිමත් දරුවකු බිහි කළ යුතුය. පන්ති කාමරයේ සිටින දරුවකු, තවත් එක් අයකු ලෙස ඔබට සිතෙන්නට පුළුවන. එහෙත් ඒ තවත් අම්මා කෙනකුගේ සහ තාත්තා කෙනකුගේ මුළු ලෝකයමය. ඒ ඔවුන් සතු වටිනාම සම්පතය. ඒ සම්පත අප වෙත එවන්නේ ඔවුන්ට කළ නොහැකි දේ අපට කළ හැකි බවට විශ්වාස කරන නිසාය. ඒ විශ්වාසය තහවුරු කිරීම අපේ වගකීමය.

අප්‍රමාණ සෙනෙහසකින්, අසීමිත කැපවීමකින් සිසු දූ පුතුන්ගේ අනාගතය යහපත් කරන්නට වෙහෙසෙන බහුතරයක් ගුරු මව් පියවරුන්ට මාගේ ශීර්ෂ ප්‍රණාමය පුද කරමි.

'ටීචර්ට ලියුමක්' කවි පන්තිය ලියැවෙන්නේ සමස්ත ගුරු පරපුරටම නොවන වග ද ලියා තබමි.

දරුවාට දෙන දඬුවමේ සීමාව කොතැනදැයි කවි පන්තිය කියවූ පාසල් ගුරුවරයෙක් මගෙන් විමසීය. මේ සටහනේ අවසානයට මා ඒ ගුරුවරයාට දුන් පිළිතුර ලියමි.

''දස මසක් මා කුස තුළ හොවා, අනේක දුක් විඳ මෙලොවට බිහිකර, ලේ කිරි කර පොවා ඇතිදැඩිකළ, මගේ ලෙයින් සෑදු මගේ දරුවා වුවද ඒ වරදම කළා නම්, මම මගේ දරුවාට දෙන දඬුවම අනික් දරුවාටත් දෙමි''.

තවත් දරුවෙක්ට අත ඔසවන්නට පෙර, වදනින් රිද්දන්නට පෙර වරද කළ දරුවා මොහොතකට එතැනින් ඉවත් කර ඔබේ සහජාත දරුවා එතැන තබා බලන්න, ඔබේ දරුවාගේ කඳුළු සහ හදවතේ ගැස්ම ඔබේ මනුස්සකම අවදි කරනු ඇත.

**සංජීවනී දහනායක**

විභාගවලින්.... 9 වන පිටුවෙන්.....

ඇත්නම් අලුත් නිර්මාණ බිහිවන්නේ නම් ඔවුන්ව නිහතමානව අප පිළිගත යුතුය. නව නිර්මාණ බිහිකළ සමහර පුද්ගලයන්ගේ ඒ නිර්මාණ උදුරා ගෙන වෙන අය ඒ තමන්ගේ යැයි කියා අනුමතිය ලබා ගෙන නිර්මාණකරුට අසාධාරණයක් සිදුකිරීම වැරදි සහගතය. ඒ නිසා ඒ වංචා සිදුකරන අයට දැඩි දඬුවම් දී එය පිටු දැකිය යුතුව ඇත.

අද සමාජයේ හැකියාවන් ඇති දරුවන්ට, ආධ්‍යාත්මික මට්ටමින් විභාග සමත් කරවීමට වඩා, හැකියාව අනුව රැකියා උත්පාදනය කළ හැකි නව ප්‍රායෝගික අධ්‍යාපන ක්‍රමයක්ද මේ රටේ බිහිකළ යුතුව ඇත. ඉන් අධ්‍යාපනික, ආධ්‍යාත්මික ගුණ වගා පූර්ණ වනුයේ නම් වඩාත් සාර්ථක වනු ඇත.

# අධ්‍යාපනය මොකටද ?

අප ගමේ අවමංගල්‍යාධාර සමිතියක් ඇත. එහි මුදල් තබන්නෝ හා සාමාජිකයෝ ගමේම අය වෙති. අප ගමේ සමහර කට කතා අනුව ''සල්ලි පිල්ලි'' ගසන අයද මෙහි නැතුවම නොවේ. කෙසේ වෙතත් ගමේ පන්සලේ හා පල්ලියේ පොදු කටයුතුවලට ද මේ සමිතිය මුදල් හා ද්‍රව්‍ය පරිත්‍යාග කරයි. මළගෙවල් ද ජයටම කරන අතර, විටින් විට සාමාජිකයෝ දඹදිව ද යති. ඉන්නා මුදල් තබන්නා හා සභාපති ඇතුළු නිලධාරීන් ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධි හෝ නැත. මගේ මව්ද මෙහි භාණ්ඩාගාරික වී ඇති නිසා මෙය හොඳාකාරවම දන්නා අතර හැමවිටම ලක්ෂ 5 කට වැඩි මුදලක් පවතී. සමහරවිට ණය සාමාජිකයනට දෙන අතර, එක් අවස්ථාවක අබලන් පාරක් හැදීමට ණයක් ලබාගෙනද එය ද පියවා ඇත.

අධ්‍යාපනය හා බද්ධ මාගේ පැනය වන්නේ රටේ මහ උගතුන් යැයි සම්මත ආර්ථික විද්‍යා මහාචාර්යවරුන් ද ඇමරිකාවේ හාවඩ් ආර්ථික විද්‍යා ඔස්තාර්ලාද පාලනය කරන රටේ මහ බැංකුව ද බේදනීය ණය උගුලක සිරවී ඉන්නේ ඇයි කියාය. රට ට්‍රිලියන 11ක් පමණ ණය යැයි පවසන අතර එම ට්‍රිලියන 11න් කළ වැඩ ට්‍රිලියන 2ක්වත් නොවීම අරුමයකි. අප බැංකුවකින් නිවාස ණයක් ගත්විට ණය තිබෙන අතර නිවස අපට හිමිවේ. එහෙත් අප රටේ ගත් ණය මහජනතාවට උරුම අතර ව්‍යාපෘතිය නොමැති හෝ අසාර්ථක ව්‍යාපෘති බවට පත්වීම බැංකු ක්ෂේත්‍රයේ මුල් පුටුවල අධික පඩියක් ගන්නා උගත් යැයි සම්මත ''සීමා චාටඩ්'' මහාචාර්යවරුන්ගේ අධ්‍යාපනය හා ප්‍රායෝගික යෙදවුම් ප්‍රශ්න කෙරුමකි.

රටේ ආර්ථිකය වැටෙද්දී අප ලබාගත් ආර්ථික විද්‍යා දැනුම ප්‍රශ්නයකි. පරණ ගම් සංස්කෘතියේදී ලුණු හා තොරම්බල් බඩු පමණක් පිටින් ගත් ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් තිබූ ලංකාවට උක්ත ආර්ථික විද්‍යාවෙන් වැඩක් වූවාද යනු දුෂ්කර පළාතක ගැමියකුට නැගෙන පැනයකි.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ලෙස වෙනම පාලනය වීමට පෙර අප රටේ ස්වයංපෝෂිත මිනිසුන් වගා කරගෙන ආහාර භුක්ති විඳ ඇති ජාතියකි. දුමේ වූ බීජ ගබඩාව වෙනුවට බහු ජාතික සමාගම් දිගුවලට යටත්වූ බීජ ගබඩා බිහිවුණි. අප පසුගිය සමයේ අත්දුටු කොරෝනා වසංගතය තුළ වගාවට එක් හොඳ බණ්ඩක්කා ඇටයකුදු සොයාගත නොහැකි වූයේ උක්ත බීජ ත්‍රස්තවාදය නිසාය. ලංකාවට අයත් බීජ ගොවිපලද නිසි පරිදි ක්‍රියා නොකිරීමෙන් ගෙවතු වගාවලට අවශ්‍ය බීජ දීමට මහාචාර්යවරුන් පාලනය කරන කෘෂිකර්මයට බැරි වූයේ ඔවුන් උක්ත බහුජාතික සමාගම්වල උපදේශක හා අධ්‍යක්ෂක තනතුරින් පිදුම් ලබන නිසාද? වරදාන වරප්‍රසාද අනියමින් ගන්නා නිසාද පැනයකි.

ඒ බහුජාතික සමාගම්වල දිගු ලෙස පොහොර හා ග්ලයිපොසේට් ජාවාරමද ලංකාවේ සරුවට වේ. ඒවායේ ඇති විෂ අධික බව නිසා රජරට ගොවීන්ගේ හා සාමාන්‍ය ජනතාවගේ වකුගඩු ඉතා කාර්යක්ෂමව ක්‍රියා කරයි. පසුගිය සමයේ එක් රාජ්‍ය නායකයකුට ජාතික වකුග ඩු රෝහල අහස සිඹින අයුරින් ඉදිකිරීමට සිදුවීම උක්ත මහාචාර්යවරුන්ගේ උත්කෘෂ්ට දැනුමෙන් හා අනුමත කිරීමෙන් රටට ආ පොහොර ව්‍යාප්තිය මොනවට පැහැදිලි කරයි.

විශ්ව විද්‍යාල සමයේ දහස් ගණන් උද්ඝෝෂණ කරන විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ ඒ අරගල ශිෂ්‍යභාවයටම සිදුකරන අතර ප්‍රාථමික උපාධිය අවසන් වූ විගස තමන් සිටි වාමවාදී, සමාජවාදී හෝ සමාජ හිතකර ව්‍යාපාර පසකලා අධික ලාභයට හා ඒ නිසා විනාශයටත් ගොදුරු වූ වාණිජ ධනවාදයට හසුවී පශ්චාත් උපාධි ලබා මහාචාර්යවරු වෙති. ඉන් කොටසක් අප කෙසේ දේශපාලනයට පරිභාව කළත්, ඔවුන්ගේ උපදේශනයන් වී අමාත්‍යාංශ තනතුරු ගෙන මස් රාත්තල් ඉල්ලන්නන් බවට පත්වීම ලබාගත් අධ්‍යාපනයේ අරුමයකි.

තවද දේශපාලනයට අප කෙතරම් චෝදනා කළත් අප රටේ හැදෙන මහාමාර්ග ඒවායේ ප්‍රමිතිය අනුමත කරන උගත් බුද්ධිමත් ඉංජිනේරුවන්ගේ හැකියාව හා අධ්‍යාපනය පෙන්නුම් නොකෙරේද ? සැම අමාත්‍යාංශයක විෂය ප්‍රවීණ නිර්දේශ අවශ්‍ය අතර බාල බෙහෙත් වගේම, රටට අත්‍යවශ්‍ය නොවන කොන්ත්‍රාත්කරුට අවශ්‍ය පරිදි ලාභ ඉපැයීමට තම අධ්‍යාපනය සාවද්‍ය ලෙස පරිහරණය කිරීමට සමාජයට විනිශ්චය කිරීමට කාලය එළැඹ ඇත.

එය ගල් අඟුරු ටෙන්ඩරයේ සිට මහ බැංකු කොල්ලය දක්වා වූ මෙගා සොරකම් වලටද

අදාළය. ඒ නිසා අපගේ අධ්‍යාපනය කෙතරම් ප්‍රතිසංස්කරණය කළද වැරදුණ තැනක් ඇත.

ඒ කරුණු නම් නැණ පමණක්ම හෙබි ගුණය රහිත අධ්‍යාපනය වේ. අනිත් කාරණය වන්නේ කඩදාසියට පමණක්ම සීමා වූ සුදුසුකම් වේ. එදා හෙළ රජවරුන් යෝධ ඇළ හැදුවේ රජරට හෝ මොරටුව ඉංජිනේරු පීඨ ඉදිවන්නට ඉතා ඈත කාලයේදීය. එදා ලිඛිත සාක්ෂි පමණක් වූ පරාක්‍රම රජුගේ සහල් ආනයනය කෙසේ සිදුවුණි දැයි උභතෝකෝටිකව පුරා විද්‍යාඥයන් සොයාබැලූ නමුත් සම්භ නොවීය. එහෙත් පුරා විද්‍යා උපාධියකුදු නොමැති වූ අයිස්ක්‍රීම් වෙළඳ මහතකු පරාක්‍රම සමුද්‍රයේ එක් ස්ථානයක් නිරීක්ෂණය කර පුරාණ ඇළ මාර්ගයක නටබුන් සොයාගත් අතර සහල් ආනයනය කර ඇත්තේ ජලමාර්ග ඔස්සේ ත්‍රිකුණාමලයට ගොස් ඉන්දියන් සාගරයට ප්‍රවිෂ්ටවී ජාත්‍යන්තර වෙළඳාමෙනි. අද අප රටේ ණයක් අරන් හැදූ හම්බන්තොට වරාය අප අවුරුදු ශතකයකට විකුණා අවසන් අතර නිකන් තිබූ ත්‍රිකුණාමලය තෙල් ටැංකි (හොඳ තත්ත්වයේ වූ) විකුණා හමාරය. දූන් උගතුන් සිටියත් වත්ත බද්දට දී ඇස්සට දත නියවීමෙන් වැඩක් නැත. දූනටමත් අපට ඉතිරිවී ඇති වටිනා ත්‍රිකුණාමලය වරාය සාරවත් ඉඩම් MCC ගිවිසුම හරහා වන කොල්ලයට විරුද්ධ උගතුන් පෙළ ගැසිය යුතු වේ.

ජාති ආලය දේශප්‍රේමීත්වය හා මානව දයාව කලා විෂය වූ විට මෙවන් සමාජ විපරීත වීම අරුමයක් නොවේ. ක්‍රිස්තුන් වහන්සේ පේදුරු හා අන් ගෝලයන් තෝරා ගත්තේ දේව ධර්මය හෝ විද්‍යාවේදී උපාධිය හෝ බලා නොවේ. සමාජ විශ්ව විද්‍යාලය තුළ හොඳ හැටි විවිධ ක්ෂේත්‍රවල මාංසගත වූ නූගත් හා පව්කාර බවට සම්මත මිනිස්සු වෙති.

පසුව ඔවුන් තුළ ගොඩනැගුණේ ද, ගුණයම පමණි. ඒ ක්‍රිස්තුධර යහගුණ ලොව පුරා ප්‍රචාරණය වූයේ ද මහා පරිත්‍යාගී, මනාව දයාව උපරිම වූ ආදරයයි. එදා කලාවැව හැදූ හෙළ වාරිමාර්ග ඉංජිනේරුවන්ගේ නිවසෙහි වූ නටබුන් නොමැති අතර ඔහු තැනවූ තාක්ෂණයෙන් අදටත් රජරට කුඹුරු කෙරෙන අතර, ඔහුගේ වාණිජ අභිලාෂයෙන් තොරවූ මනා දයාව අදටත් අපි භුක්ති විඳිමු. අද කලාවැව ඉදිකෙරුවේ නම් ඉන් කාලයක් පමණට ඉදිවී කලාවැව තරමටම විශාල වූ නිවසක් තනන කොන්ත්‍රාත්කරුවන් අද සිටින්නේ ජාතියේ බේදයක් බව හඟවමිනි.

2019 මහ බැංකු වාර්තාව අනුව අප දළ ජාතික නිෂ්පාදනයේ පහළ බැස්ම, විදේශ සංචිතවල අඩුවීම නිරීක්ෂණය වනු අතර, 2020 එය තවත් පහළ බැස ඇත. අපට පහළ වූ සෝමාලියාව අපව පසුකර ගොස් ඇත. 2018 එය ඩොලර් බිලියන 88.4 කි. 2019 දී 84 කි. මින් අධ්‍යාපනයට 6% උද්ඝෝෂණ තියා ඉල්ලුවද අයවැයෙන් ලැබෙන්නේ 1.5% කට ද අඩු අගයකි. ඒවාද පඩිනඩි හා ගොඩනැගිලි අලුත් වැඩියාවට ගොස් හමාර වේ. අධ්‍යාපනය යනු ඉතා වැදගත් ආයෝජනයකි. එයට සියයට 10 පමණ යෙදවීම ඉතාම උචිත වනසේම, ආර්ථිකයට හා සමාජීය සංවර්ධනයට උචිත වන ලෙස ඒවා පිළිසකර කිරීම හෝ යල් පැන ගිය ක්‍රම හා විශ්‍රාම යැවිය යුතු ඉහළ පුටු ගෙදර යැවීම අත්‍යවශ්‍ය වේ,

ආර්ථිකය දියුණු කිරීමට නොහැකි ආර්ථික විශේෂඥයන්ගෙන් රටට තබා ඔවුනටද ප්‍රායෝගිකතාවක් නැත. ධර්ම විනය ඉහළින්ම උගත් සමාජීය ප්‍රේමය බින්දුව වූ පරිසින්ට හා සදිසිවරුන්ට එදා ක්‍රිස්තුස් වහන්සේ කෙරොටිකයන් කීවේ එබැවිනි.

අධ්‍යාපනයට ගොඩනැගිලි සෑදීමට මත්තෙන් නිවැරදි ප්‍රතිපත්ති සම්පාදනය අත්‍යවශ්‍ය වේ. ඊනියා ආචාර්ය උපාධිකරුවන්ට වඩා පන්සල් පල්ලි මූලික කරගත් කතිකාවත්, පොදු අධ්‍යාපනය කොමිසමක් යොදා ගෙන පළමුව කුඩා ළමයින්ගේ හර පද්ධති කුඩා මොළ ගෙඩිවලට ඇතුළත් කළ යුතුවේ. අවුරුදු 12-13 වනතෙක් කුඩා ළමයි ආශ්‍රය, හර පද්ධති හා සමාජීය වින්‍යාසය ලබාගන්නා අතර ඉන් එහාට ඒ දරුවන්ගේ මනස ස්වාධීනව ගෙනයාමට බලපායි. ඒ අනුව අවුරුදු 13 වන තෙක් කෙනකු ඉතා යහපත් වන්නේ ඉතා ප්‍රබල ආත්මීක වෙනසකිනි.

උක්ත කරුණු සමාජ විද්‍යාව හා ළමා මානසික වෛද්‍ය විද්‍යාවට කාරණ වේ. ඒ නිසා ශිෂ්‍යත්වය වැනි මන්ද මානසික චෛතසික සඳහා දෙක වසර සිට අප රටේ පන්ති පැවැත්වේ. ළමා මනස අශ්ව රේස් එකට තබන්නේ නැතිව ලොවම ඉදිරියට ගිය රටවල අධ්‍යාපන ක්‍රමය සසඳනු මැනවි. පින්ලන්තය හා ජපානය අධ්‍යාපනයේ ඉහළින් කරගෙන යන රටවල් ය. ඉතාලියෙහි ක්‍රියාත්මක වන "රේනි එම්මානුවෙල්" පෙර පාසල් ක්‍රමය හා ඇමරිකානු "SAT" ක්‍රමය විශ්ව විද්‍යාල ඇතුළත් වීමට වැදගත් වේ යැයි මා යෝජනා කරන අතර, තරඟකාරී මනසක් සාදන අධ්‍යාපනයෙන් ලැබෙන

හික්මවීමට මහ බැංකු වාර්තා අවශ්‍ය නොවන අතර මහමග දක්නට හැකි වේ. එකිනෙකා පරයා යැමට වෙර දරන ත්‍රීවීලර් හා මෝටර් සයිකල් ඊට හොඳම නිදසුන වේ. ඔවුන් 'හෝන්' ගසා ඉඩ ඉල්ලා යන්නේ ඉතා හදිසි ශල්‍යකර්මයට නොව ගෙදර ගොස් නිදා ගැනීමටය. නැණ පමණක් ඇති සමහර විශේෂඥ වෛද්‍යවරුන් තමන්ට අයිති රෝහලේ නැති අතර ඇතිහැකි අයව ඒමට හැකි පෞද්ගලික රෝහලේ පැය 24 දීම ඇත. ඒ මුදල් වලට මිස මනුස්සකමට නොවේ.

විදුලිබල මණ්ඩලය කෝටි ගණන් පාඩු ලබාදී එහි අධ්‍යක්ෂකවරුන් යන්නේ අධි සුඛෝපභෝගී රථවලය. රජය මැදිහත් වී සූර්ය බලය විදුලිය හඳුන්වාදීම නුවණට හුරු වූවත් එහි වූ සමහර ඉංජිනේරුවන් වැඩිපුර තම මනස යොදවන්නේ පෞද්ගලික "solar" කම්පැනිවලටයි. ඉතා උත්කෘෂ්ට බලි, තරු, රාවණ, ගැමුණු හා විජයබා යුග තිබූ ශ්‍රී ලංකාවේ ගුවන් යානා ලොවටම ඉදිරිපත් කර තිබූ (සාක්ෂි නොමැති ඉතිහාසය - රාමායණය) පුද්ගලයන් කිහිපදෙනකු හෝ වරදින් ඩොලර් මිලියන ගණන් (airbus) සමාගමට ගෙවන අතර ඒ මුදල් යන්නේද අපගේ පොකට්ටුවෙන් වීමද ඛේදයකි. මින් සමහරු ගුවන් යානාවක් ළඟට ද දැක නැති මැගී අක්කලාද සිරිපාලලාද වෙති. උක්ත කරුණු කොයිතරම් සාධාරණ ද?

අවසන් වශයෙන් කතෝලික පාසල්වල අප විශේෂ ස්තුතියක් දිය යුතු අතර එය ඔවුන් ප්‍රගුණ කරන විනයයි. කුඩා අඩුපාඩුකම් තිබුණත් පැවිදි උතුමන් කරන පාසල් අන් පාසල් වලට වඩා සාපේක්ෂව විනය ඉහළ හා අන් ආගමික අය තුළ පවා ගෞරවාදරයට පත්ව ඇත. එහෙත් කෙනකු වෛද්‍ය ඉංජිනේරු විද්‍යා පීඨවල තේරෙන පිරිස අඩු යැයි මහා මන්ද මානසික තර්ක ඉදිරිපත් කරනු මට ද ඇසී ඇත.

ඊට නිසි පිළිතුර වන්නේ කොළඹ සුපිරි යැයි සම්මත පාසල් හා සමහර පලාත්වල ඉහළ පෙළේ ජාතික පාසල්වලට 5 වසරේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත ඇතුළත් වන දරුවන් අපොස සාමාන්‍ය පෙළ හා උසස් පෙළවලට දක්වන ප්‍රතිඵල වේ. සියලුම කුඩා පාසල්වලින් තෝරා බේරා ගැනීමෙන් හොඳ නියැදියක් තනා එයට ඉහළ ප්‍රතිඵල ලැබීම අරුමයක් නොවේ. උක්ත ප්‍රසිද්ධ පාසල්වල දක්ෂ ළමයින්ගේ ස්වශක්තිය හා ඉගෙනීමට වූ ඡානමය ප්‍රවේණිය ඉහළ වේ. **ගුරුවරුන්ගේ පරම කාර්යය වන්නේ දක්ෂතා අඩු හා ගුණයෙන් අඩුලුහුඬු ඇති දරුවන් ඉන් ඉහළට ඔසවා තැබීමයි. වෛද්‍යවරයා අවශ්‍ය වන්නේ රෝගීන්ට මිස නීරෝගීන්ට නොවේ. අති දක්ෂ ගුරුවරුන් අවශ්‍ය වන්නේ අති දක්ෂ ළමයින්ට නොව දක්ෂකමින් අඩු දරුවන්ටය. එමෙන්ම දක්ෂ ළමයින් සියල්ල එකතුකරගෙන පදක්කම්, ගෞරව, නම්බු, කීර්තිනාම දරමින් වැජඹෙන පාසැල් බොහොමයක් එලෙස වැජඹෙන්නේ පූර්වයේ පාසැල්වල සිටිය ඒ දක්ෂ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සම වයසේ දරුවන් සිටින පන්තිවලට කරන බලවත් අසාධාරණයක් හරහාය. ඔවුන් පළඳන කදිම මැණික් මාලයට එක මැණිකක් පමණක් ඇති පාසල්වල දක්ෂ මැණික්කැට වන් දරුවන් ගෙන යාම, එම පාසල් වැසී යාමට හේතුවකි.** මින් වන්නේ ඔවුන් හා ඉගෙනීමට වූ අයිතිය දුප්පත් පාසල් වලට අහිමි වී යාමයි. අවසන් කොට එදා දාවිත්ට නාතාන් දිවැසිවරයා කී උපමාව අදටද වලංගු බව මට හැඟේ. (2 සාමුවෙල් 2:4).

**අති දක්ෂ ළමයින් කියා අප කියන්නේ අප හදාගත් විභාග ක්‍රමයෙන් මිස අන් මිනුම් දණ්ඩකින් නොවෙයි.** අප විභාග ක්‍රමය ඉතා යල් පැන ගිය විභාග ක්‍රමයකි. අප ඉහළ බලධාරීන් ක්‍රියාත්මක කරන්නේ උක්ත මිනුම් දඬු සම්මත කරගෙන දක්ෂ ළමයින් ප්‍රසිද්ධ යැයි කියන පාසැල් තුළ ආභරණ විදිහට පාවිච්චි කිරීමය. ඊට එහා ගිය මගේ පාසැල කියා ආඩම්බර කරනුයේ හොර පාරෙන් හා මුදල් බලයෙන් ගිය ඇත්තෝ වෙති.

මේ ප්‍රාදේශීය බුද්ධි ගලනය ඉතා අහිතකර වන්නේ දක්ෂ යැයි සම්මත දරුවන් ඉතා ඉහළ තරගයකට කොළඹ දී මුහුණ දී ඉතිරි වී ඇති ගුණය ද ඔවුන්ගෙන් පිරිහී යාමයි. ඉතින් ඔවුන් ඉහළ පුටුවල ඉන්නා කළ ගුණදම් අපට අපේක්ෂා කළ නොහැකිය. කතෝලික පාසල් 1 වසරේ සිට ඒ සංසයම ඉහළට ඔසවා තැබීම නියම ක්‍රිස්තු වටිනාකමක් වේ. සමාජයට වෛද්‍ය ඉංජිනේරු පමණක් නොව අනිකුත් විෂය පථවලද ප්‍රවීණයන් අවශ්‍ය අතර සාංඝික බැම්ම බැඳීමට ගුණවලින් හෙබි යදම්ද අවශ්‍ය වේ.

23 වන පිටුවට.....

**වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්**
ජ්‍යෂ්ඨ වෛද්‍ය නිලධාරී උ.කො.
ශික්ෂණ රෝහල

සමබර..... 13 වන පිටුවෙන්.....

ගුරුවරියකි. මෑතකදී ඇය ඒ අතීතය මා හා සුහදව සිහිපත් කළේ, මටද යමක් සිතීමට ඉඩ සලසමිනි.

දරුවකුගේ අනාගතය තීරණය කරන ප්‍රබලතම සාධකය අ.පො.ස. (උ./පෙ.) විභාගයයි. උසස් යයි සම්මත ක්ෂේත්‍රයට දරුවා යොමුකිරීමට සිහින දකින දෙමාපියන්ගේ එකම අපේක්ෂාව "A" සාමර්ථ්‍ය ලබා ඉහළ "Z" අගයකින් සරසවි වරම් ලැබීමයි. උපරිමව වෙහෙසීම ප්‍රතිඵල සඳහා අවශ්‍ය වුවද, විභාගය, ජීවිතය විඳවන මානසික වධයක් කොටගෙන සැහැල්ලුවෙන් සූදානම් විය යුතුය. එහෙත් උපාධිය පමණක්ම ජීවිතයේ තීරණාත්මක ගමන් මඟක් වීම අනවශ්‍යය.

විශ්වවිද්‍යාල වරම් හිමිවන්නේ, අපේක්ෂකයන්ගෙන් 10% කට පමණකි. එහෙත් අද වන විට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වඩාත් පුළුල් වී තිබීම අනාගත පරපුරේ භාග්‍යයකි. උසස් පෙළ සමත්වීම පමණක්ම තෘතීය අධ්‍යාපනයට සුදුසුකමක් වේ. වෘත්තීය අධ්‍යාපනය ඇතුළු විවිධ අධ්‍යාපන අවස්ථා බහුලය.

අධ්‍යාපනයෙන් බිහිවිය යුත්තේ, ශාස්ත්‍රීය දැනුමින් හිස පුරවාගත් සමහර විට එක් විෂයක් සම්බන්ධයෙන් පමණක් මහා දැනුම් සම්භාරයක් ඇති, විභාග සමත් කළ, නමින් පමණක් උගතෙක් නොවේ. නිර්මාණශීලී චින්තනය ප්‍රගුණ කළ, ජීවිත ගැන, සමාජය ගැන වැඩි පරාසයක් තුළ සිතීමට හැකි බුද්ධිමතෙකි. අනාගතයේ කාර්යක්ෂම හා ඵලදායී පුරවැසියන් ලෙස කටයුතු කළ හැකි, උසස් චින්තන හැකියා සහිත පුද්ගලයන් බිහිවිය යුතු බව අධ්‍යාපනඥයන්ද පෙන්වා දී ඇත.

'හොඳ අධ්‍යාපනයකින්' හොඳ පුරවැසියකු බිහිවේ. දැන් පවතින අධ්‍යාපන ක්‍රමය හා විභාග ක්‍රමය මගින් එය සාක්ෂාත් කරගත හැකි වේවිද? මෙරට අධ්‍යාපන ක්‍රමය දැන්වත් සකස් නොවේනම්, අප මාතෘ භූමිය කෙබඳු මාවතකට යාවිද?

ප්‍රවීණ රංගනවේදී ජයලත් මනෝරත්නයන් සිය 'ගුරු තරුව' වේදිකා නාට්‍යය තුළින් විමසන්නේද මේ පැනයයි.

"අප කොහේද මේ යන්නේ
රට කොහේද මේ යන්නේ
කොතැන තිබෙන වරදක්දෝ
කවදා කොතැනක කවුරු කරපු වරදක්දෝ
මුළු ලොවටම ආදරය කරන්නට
හැකි මිනිසුන් බිහිවන මතු දවසක
ඔබත් සිනාසී මමත් සිනාසී,
ලොවම සිනාසෙන ඒ දවසේ
මුළු ලොව ඔබට කියයි මෙලෙසේ
මම ආදරෙයි, මම ආදරෙයි, මම
ආදරෙයි"

## අමිතගේ හද ගැස්ම.....




අධ්‍යාපනය..... 22 වන පිටුවෙන්.....

මේ සියල්ල තේරුමක් නැති ශිෂ්‍යත්වය වැනි තරඟකාරී මනසක් පතන අධ්‍යාපනයේ වරද වේ. අප මිනිසුන් ධාවන තරග අවසානය හැරී බලද්දී ඉතිරි කිසිවක් නැත.

**අධ්‍යාපනයේදී වයස අවුරුදු 13 ක් පමණ වනතුරු හර පද්ධති, සමාජ සම්බන්ධතා හා නෛසර්ගික හැකියා ඉස්මතු කිරීමත් ඒ ඔස්සේ හඳුනාගත් හැකියාව හරහා විෂය පථය තීරණය කරනු භාෂා ත්‍රිත්වයක් (ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ, කැමති තෙවන භාෂාවක් - ප්‍රංශ, චීන) අවුරුදු 17 කදී විශ්ව විද්‍යාල ප්‍රවේශයට මැනවි.**

# ඕං එහෙනං



විභාගෙ විභාගෙ ඒක තමයි අභාගෙ විකෘති නාටකෙ එහෙම කියනවා
කලා වාණිජයි බයෝ ද සයන්ස් ද කැටිකොට මොළටික සුණු කරලනවා
ආතති පීඩන හිසේ රුදාවට චැනලින් පෝලිමේ කල් ගත වෙනවා
නිදි නැති දෙනෙතට පොත් ගුල්ලන් වගෙ පොත් උඩ බාගෙට නිදියනවා

හවසට ටියුෂන් සති අග ටියුෂන් ටියුෂන් ටියුෂන් කඩ යනවා
ටියුෂන් සර්ගෙ අතමිට සරු වී දෙකේ රෝදෙ හතරින් යනවා
පුතාල දූලගෙ ඉදිරිය සිතලා ගේ දොර උගසට බිලි දෙනවා
තර්ජන වර්ජන පිකටිං මැද්දේ ගිනිගෙන ඔලුගෙඩි රත් වෙනවා

කැම්පස් රිංගලා දහදුක් විඳලා උපාධි කරගහගෙන එනවා
පට්ටම ගේ මැද වඩම්මවා ගෙන උදේ සවස දුම් අල්ලනවා
ඉල්ලුම් යවනා කැඳවීමක් නෑ රැකියා පෝලිමෙ ළත වෙනවා
වයසට යනවා රැකියා සොයනා දරු මල්ලොත් පාසැල් යනවා

කොරෝනා ඇවිදින් කරපු හුටපටේ මරබිය මැද පාසැල් වැහුවා
පාසැල් දරුවෝ ගෙදර හිර වුණා පාසැල් වැඩ කටයුතු නිමා වුවා
දරුවන් හට ඒ සිදුවූ පාඩුව හෙට ලෝකය හට අනතුරක් වුවා
කියලයි උගතුන් පවසා ඇත්තේ දෙගුරුන් ඒ ගැන සිත යුතුවා

අපො සාපෙයි උපෙ විභාගෙයි මාස ගණන් කල් ගත වෙනවා
දරුවන් තුළ ඇති ඒ ගැන බිය සැක දින දින ටික ටික වැඩිවෙනවා
ජීවිත කඩයිම ඉරණම විසඳෙන විභාගෙ දැන් ළඟ ළඟ එනවා
අනේ දරුවනේ හිතට වෙර අරන් නිරවුල් මනසක් ඇති කරගත යුතු වෙනවා

ලොකු ලොකු විභාග අස්සෙත් පොඩි පහේ විභාගයක් ළඟ හිනැහෙනවා
අම්මල පොරකන දඟ ගෙට දක්කන විභාගෙ එය යයි කියැවෙනවා
කොරෝන ඇවිදින් ටියුෂන් වැහුවේ දරුවගෙ හොඳටයි මව සිතුවා
පහේ විභාගේ ඕනද කියලා දෙවරක් හිතන්න සිදු වෙනවා

**සූරිය මාමා - ජෝසප් ඩයස්**

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය





තරුෂි තුන වසරේ ඉගෙනුම ලබන දැරියකි. ඇගේ උපන් දිනය යෙදී තිබුණේ පසුගිය දිනකය. පවුලේ ළඟම හිත මිතුරන්ගේ දරුදැරියන් එකතු කර පුංචි උපන් දින සාදයක් පැවැත්වූවා. තරුෂිගේ උපන් දිනයට තාත්තාගෙන් ඉල්ලලා තිබුණේ, ගිරවෙක් ගෙනත් දෙන ලෙසයි. එය එසේම සිදුවූයේ උපන්දින සාදයේදීය. කූඩුවක දමන ලද මාල ගිරවෙක් තරුෂිට තෑගි ලැබුණේය. ඇය හරියට සතුටු වූවාය. ගිරවාට සත්කාර, සංග්‍රහවලින් නම් කිසිදු අඩුවක් නොවීය.

ගෙයි පිටුපස කූඩුව එල්ලා තිබුණ නිසා ඌ කෑ ගසන හඬට තවත් ගිරවුන් තුන් හතර දෙනකු උගේ කූඩුව අසල කැරකෙනු දක්නට ලැබුණි. එය කාගෙත් සතුටට කරුණක් විය. කවුරු කෙසේ සතුටු වුණත් කූඩුව ඇතුළේ සිටි ගිරවා දැඟලුවේ එළියට යන්නටමය. දිනක් තරුෂිගේ මාමා ඇතුළු පවුලේ සැම තරුෂිගෙ ගෙදරට පැමිණියේ එදා නිවාඩු දිනක් නිසාය. වැඩිහිටි අය සතුටු සාමිචියේ යෙදී සිටියදී පුංචි කට්ටිය එක එක සෙල්ලම් කරන්නට විය. ඒ අතර වැඩි දෙනාගේ අවධානය යොමුවුණේ කූඩුවේ සිටි ගිරවා දෙසටය.

මාමාගේ දුව පුංචි හෂිනි අවුරුදු තුන හතර තරම් වූ පෙර පාසල් යන දැරියකි. සියල්ලන් ගිරවා සමඟ කූඩුව ළඟට වී සතුටු වෙද්දී හෂිනි පැත්තකට වී සිටින විට ඌ කූඩුවෙන් එළියට යන්නට දඟලන හැටි ඇය දුටුවාය. ඇයට දුක සිතුණි. තරුෂි ළඟට ගිය හෂිනි ...... තරුෂි අක්කේ, ....... පව් සිද්ධවෙන වැඩ කරන්න එපා අක්කේ....... ඕවා හොඳ පුරුදු නෙවෙයි........ කියලයි අපේ ටීචර් අපිට ඉගැන්නුවේ. අනේ අක්කේ ඔය ගිරවාව කූඩුවෙන් එළියට ඇරල දාන්න.

ආදර දුවේ පුතේ සතා - සිව්පාවා වුණත් නිදහසේ ඇවිදින්න, නිදහසේ ඉගිලෙන්න, නිදහසේ කෑම ටිකක් සොයාගෙන කන්න තමා උන් ආශා කරන්නේ. කූඩුවක හිරවෙලා ජීවත් වෙන්න උන් කැමති නැති විත්තිය තේරුම් ගත්ත හෂිනි වගේ නංගියෙක් වෙන්න අපිත් අදිටන් කර ගනිමු.

**සූරිය මාමා**

## ලොව සොඳුරුය - ඒ දෙව් පෙම

ඈත අහසෙ නිල් පාටට - සුදු පාටින් රටා මවන
සුසුදු වලාකුළුවල හැඩ - කවුරුද දුන්නේ....

නෙක විසිතුරු හරිත වර්ණ
තුරු පෙළ හිනැහෙන ලස්සන
කුරුලු ලොවට ඉඩදෙන්නට
කවුරුද කීවේ....


කොළ කහ රතු වර්ණ ලබා
ඉදී සුවඳ ලොවට බෙදන
පලවැලවල මිහිරි රසය
කොහෙන්ද ලැබුණේ....

පාට පාට විසිතුරු ගෙන - නේක සුවඳ විහිදුවමින්
සරසන්නට මල් ලෝකය - කවුද පැවසුවේ....

මේ හැම හොඳ දේ අරගෙන
ලෝකෙට සෙත සලසන්නට
මැවුම්කාර දෙවි සමිඳුන්
අප හට කීවේ....

**එල්. කාවින්ද්‍යා දේශානි ප්‍රනාන්දු**
11 ශ්‍රේණිය
සා. ජෝන් ද බැප්ටිස් ම.වි.
නාගොඩ, කඳාන.

## ප්‍රහේලිකා අංක - 61



**හරහට**

1. ගොයම් කැපූ පසු ඉතිරි වන දේ.
2. පිලිපීනයේ භාවිත වන මුදල් ඒකකය.
4. මන්නාරම, වව්නියාව සහ මුලතිව් යන දිස්ත්‍රික්ක තුන ඇතුළත් වන ඡන්ද සඳහා භාවිත වන තනි දිස්ත්‍රික්ක නාමය.
6. නව දේශපාලන ප්‍රවාහයකි.
8. දේශීය කෘෂිකර්මාන්තයේ එක් කන්නයකි.
9. ක්‍රිෂ්ණාට පෙම් බැඳි කාන්තාව.
11. "කත" සමාන අරුත් දේ.
14. කමල් අද්දරාරච්චි මහතා රඟපෑ මෑත කාලීන සිංහල චිත්‍රපටියකි.
15. ශ්‍රී ලංකාවේ ජනගහනය අතින් අධිකම දිස්ත්‍රික්කය.
17. ශරීරයේ රුධිරය සංසරණය වන්නේ මේවා මඟිනි.
18. "ශ්වේත" වර්ණය.
19. ශු. සභාවේ නිල යාච්ඤාව මේ නමින් හැඳින්වේ.
20. "අලංකාර" යන්නට සම අරුත් දේ.

**පහළට**

1. සතුන්ට ඇති අපට නැති.
3. මාර්ටින් වික්‍රමසිංහ සූරීන් විසින් රචිත ග්‍රන්ථයකි.
4. අයිතිවාසිකම් ලබන්නා සේම අප ද ඉටු කළ යුතු වේ.
5. L. T. T. E. සංවිධානය තම සංවිධානයේ නිල පුෂ්පය ලෙස භාවිතා කළේ.
6. ශ්‍රී ලංකාවේ පවතින ජනාධිපති ක්‍රමය.
7. ප්‍රවේගය වෙනස් වීමේ ශීඝ්‍රතාවය.
10. ඌව පළාතේ දිස්ත්‍රික්කයකි.
12. "අපර්ණා" ලෙස හැඳින්වෙන හින්දු දේවතාවිය.
13. නෙබුකද්නසර් ජුදා දේශය ආක්‍රමණය කරන විට ජුදාහි රජකම් කළ ජෙහෝයාකීන් රජුට තවත් නමක්.
16. විස්මයට සම අරුත් දේ.
17. ත්‍රිවිධ හමුදාවලින් එකකි.
18. ශ්වේත වර්ණය.

සැකසුම :

**ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා**
මීසම් සේවක, ඇඹිලිපිටිය.

## ප්‍රහේලිකා අංක 59 ජයග්‍රාහකයෝ

**පළමුවන ස්ථානය** - මාටිනා පෙරේරා
4s 1, සා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07.

**දෙවන ස්ථානය** - සුජායී අතුකෝරල
13 ශ්‍රේණිය, ශ්‍රී කුරුස විදුහල, ගම්පහ.

**තෙවන ස්ථානය** - ඔනාර ඩිහේන් බොතේජු
5 ශ්‍රේණිය, හලා/ වෙන්/ වැකඩ මහා විදුහල, වැකඩ, යෝගියාන.

ඔබගේ පිළිතුර තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, **2020 ඔක්තෝම්බර් 31** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙලින්, රු.1000.00, රු. 750.00, රු. 500.00** බැගින් පිරිනැමේ.

**විශේෂ මතක් කිරීමක්** - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.

ප්‍රහේලිකා අංක - 61
"ළමා ප්‍රබෝධනය",
අංක 265, ඩීන්ස් පාර, මරදාන,
කොළඹ 10.

# අපේ ගුරුතුමිය

ගුරුතුමී මව්පියන් සේ
අපහට හොඳ නරක කියා දේ....
ගුරුතුමිය හොඳටම වෙහෙස වෙලා
පාඩම් උගන්වයි

හිතට නිදහසක් දැනේවි
ගුණ නැණ පාඩම් හොඳටම
ඉගෙන ගන්න ඕනේ දැන්
පුංචි අප ගුරුතුමියට හරිම ආදරෙයි....

පුංචි අපේ නරක දේ
හොඳ දේ කරයි....
පුංචි අපට ගුරුතුමිය හරිම ආදරෙයි....
පාසලේදී මගේ අම්මා චමිලා ගුරුතුමී....

W. M. **තරුන්දි මීරියම් රවීණා ප්‍රනාන්දු**
3 ශ්‍රේණිය I ශුද්ධවූ පවුලේ බාලිකා ප්‍රාතමික
විදුහල,වෙන්නප්පුව.

# සොබා අසිරිය

පාවෙලා යන සුළඟේ - පාවෙන්නට ආසා වුණි
එහෙත් පාවෙන්නට බැරි නිසා - මම දුක් වෙමි....

ගලන දිය දහරේ - පීනන්නට ආසා වුණි
එහෙත් පීනන්නට බැරි නිසා - මම දුක් වෙමි....

# මරි මවුගේ මාතාවෙනි

සාන්ත ආනා මැණියනි - අප ග්‍රාමයේ රැකවලෙනි
අපේ දුක සැප - බලන්නට ආ....
මරි මවුගේ මාතාවෙනි

පළගතුරේ නිති වැජඹෙන
සැම නපුරෙන් අප ගලවන
අප සැම යහ මඟට ගෙනෙන
මරි මවුගේ මාතාවෙනි

**එරේස් ප්‍රනාන්දු**
10 A ශ්‍රේණිය
පළගතුර දහම් පාසල

# මරි මව්නි

රෝස කුසුම් බරවෙන තැන සුවඳ හමනවා
නීල ජලය බැසයන තැන සිසිල දැනෙනවා
කුරුලු රංචු එක්වෙන තැන ගීත ඇසෙනවා
දේව අම්මා වඩිනා තැන සතුට රැඳෙනවා

ඔබ ශ්‍රී වත දකිනා සැම දෙන වසඟ වනා
රැ අහසේ බබළන තරු ඔබ නෙත් වැන්නා
දෙඅතින් විහිදෙ රැස් ලෝකෙටම සෙතවනා
බැහැපත්කම වැනි ගුණ ඔබෙ හදින් විහිදෙනා

ජන්ම දොසෙන් රහිත දියණි ඔබයි මැණියේ
සියලු දුකට අසරණයට සරණ ඔබ අනේ
එන එන හැම දුකට මගේ ඔබ පිළිසරණේ
දේව පුතුන් ඉදිරියේ අප නිසා යදින්නේ

සියලු සතට සතුට බෙදන ඔබ අපෙ අම්මා
ජපමාලයේ බලය පාන සරණය ඔබ අම්මා
මල් ගොමු පිරි තැනට වඩින පෙම්බර අම්මා
මගේ දුකට සතුට දුන්නට තුතිවේ අම්මා

**වින්දන සාවින්ද**
(10 ශ්‍රේණිය) සා. චාල්ස් දහම් පාසල,
විල්ලෝරවත්ත, මොරටුව.

## ආදරණීය දරුවනි

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සන නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි, සිතුවිලි
ආදී වශයෙන් ලබා ගැනීමට,
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
ඔබගේ භාරකරුගේ
දුරකතන අංකය සහ ලිපිනය ද
අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා.**
**"භක්ති ප්‍රබෝධනය"**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

# කතෝලික ධර්මය

## අ.පො.ස. (සා./පෙළ) විභාගය - 2020
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. "මම පූජාවලට වඩා කරුණාවට කැමැත්තෙමි දවන යාග පූජාවලට වඩා දෙවියන් වහන්සේ පිළිබඳ අවබෝධයට කැමැත්තෙමි". මේ වගන්තිය සඳහන් වන දිවැසිවර ග්‍රන්ථය කුමක්ද?

(i) ජෙරමියා දිවැසිවර ග්‍රන්ථය (ii) ආමොස් දිවැසිවර ග්‍රන්ථය
(iii) හොසියා දිවැසිවර ග්‍රන්ථය (iv) යෙසායා දිවැසිවර ග්‍රන්ථය

02. හැම පාපයකටම හේතු වන්නේ කුමක්ද?

(i) ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි නොවීම. (ii) දිවැසිවර අනාවරණ අනුව ජීවත් නොවීම.
(iii) ශු. පවුල හඳුනා නොගැනීම. (iv) දෙවියන් වහන්සේව නොදන්නාකම.

03. A - නැකතට මුල්ගල තැබීම.
B - මව්පියන්ව හුදෙකලා කිරීම.
C - ශුද්ධ ලියවිල්ල වැරදි ලෙස අර්ථකථනය කිරීම.
D - දුම් පානය.
E - තම හැකියා හා දක්ෂතා මත පමණක් ක්‍රියා කිරීම.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන පළමු පනතට විරුද්ධ ක්‍රියා ඇතුළත් පිළිතුර වන්නේ,

(i) A D B (ii) B C E (iii) A C E (iv) B D E

04. ශු. පාවුලු තුමා දරුවන්ට හා දෙමාපියන්ට අවවාද කර ලියන ලද ලිපියේ නම කුමක්ද?

(i) එපීසි ලිපිය (ii) රෝම ලිපිය
(iii) ගලාති ලිපිය (iv) පිලිප්පි ලිපිය

05. "මාගේ පුත්‍රය, පියාගේ අවවාද අසන්නී මවගේ උපදෙස් ඉවත නොදමන්න" මෙම වගන්තිය සඳහන් වන්නේ කුමන පොතේද?

(i) මතෙව් සුවිශේෂයේ (ii) හිතෝපදේශය තුළ
(iii) ගලාතිවරුන්ගේ ලිපියේ (iv) නික්මයාම පොතේ

06. දෙවියන් වහන්සේ අපට පවරා ඇති ජීවිතයේ හිමිකරු කවුද?

(i) දෙමාපියන් (ii) දෙවියන් වහන්සේ
(iii) ආදිපියවරු (iv) නායකයන්

07. සත්‍යතාවේ උල්පත වන්නේ කවුද?

(i) දෙවියන් වහන්සේ (ii) ආබ්‍රහම් තුමා
(iii) ජාකොබ් තුමා (iv) මරිය තුමිය

08. නික්මයාම 20:16 ට අනුව 8 වන පනත නම් කරන්න.

(i) අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියව.
(ii) නුඹේ අසල්වැසියාට විරුද්ධ නොව.
(iii) නුඹේ අසල්වැසියා සමග සාමයෙන් ජීවිතයක් ගත කරව.
(iv) නුඹේ අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියව.

09. "අනුන්ගේ දියුණුවට අකුල් හෙළීම" කීවෙනි පණතට විරුද්ධ ක්‍රියාවක්ද?

(i) 8 වෙනි පණත (ii) 4 වෙනි පණත
(iii) 5 වෙනි පණත (iv) 7 වෙනි පණත

10. විශ්වාසයේ ජීවිතයක් ගතකළ පුද්ගලිය වන්නී,
(i) මාර්තා (ii) එලිසබෙත් තුමී (iii) මරිය තුමී (iv) රෙබෙකා

11. "රාදා" යන හේබ්‍රෙව් වචනයේ සිංහල අර්ථය වන්නේ,
(i) බලය (ii) ශක්තිය (iii) ආරක්ෂාව (iv) පාලනය

12. එක්වරු ශීලය රැකීමේ ප්‍රධාන පරමාර්ථය කුමක්ද?
(i) සතුටක් ලැබීම. (ii) දන්දීම. (iii) කුසගින්නේ සිටීම.(iv) නීතිය රැකීම.

13. "වසරකට වරක් වත් පාපෝච්චාරණය කිරීම" මෙය,
(i) ප්‍රසාද නිධානයකි. (ii) පණත් දහයෙන් එකකි.
(iii) ශුද්ධවූ සභාවේ ශික්ෂා පදයකි. (iv) ශුද්ධාත්ම දීමනාවකි.

14. ශාරීරික පුණ්‍ය ක්‍රියා පමණක් ඇති පිළිතුර තෝරන්න,
(i) වහලුන් නිදහස් කිරීම. / අඥානයන්ට ඉගැන්වීම.
(ii) රෝගීන් බැලීමට යෑම. / ආගන්තුකයන්ට නවාතැන් දීම.
(iii) වැරදි කමා කිරීම. / දුකින් පෙළෙන්නන් සැනසීම.
(iv) මළවුන් වැළලීම. / ජීවතුන් හා මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම.

15. නුඹේ සහෝදරයාගේ ලේ පොළොවෙන් මට මොර ගසයි. මේ හා සම්බන්ධ සිදුවීම කුමක්ද?
(i) ආබ්‍රහම් විසින් ඊසාක් පූජා කිරීම.
(ii) ජෝසප්ව සහෝදරයා විසින් ගැල් කරුවන්ට විකිණීම.
(iii) කායින් විසින් ආබෙල් ඝාතනය කිරීම.
(iv) ස්නාවක ජුවාම් තුමාගේ හිස ගසා දැමීම.

16. තම සහෝදරයාට මෝඩයා කියා ගරහන තැනැත්තාට සිදුවන්නේ කුමක්ද?
(i) ඔහු දේව රාජ්‍යයට හිමිකම් කියනු ඇත.
(ii) ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වනු ඇත.
(iii) ඔහු දෙවියන් වහන්සේගේ දරුවකු වනු ඇත.
(iv) ඔහු ස්වර්ග රාජ්‍යයේ කොටස්කරුවකු වනු ඇත.

17. සාමය වෙනුවෙන් යැදුමක් කරන ලද ශුද්ධවන්තයා කව්ද?
(i) ශු. තෙරේසා මව්තුමිය (ii) ශු. අන්තෝනි මුනිතුමා
(iii) ශු. මරියා ගොරෙට්ටි තුමිය (iv) අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමා

18. ජේසුස් වහන්සේගේ දෙවන ආගමනයේදී අපව විනිශ්චයට ලක් කරන මිනුම් දණ්ඩ කුමක්ද?
(i) පුණ්‍ය ක්‍රියා (ii) ශික්ෂා පද (iii) දස පණත (iv) දේව ප්‍රසාධ නිධාන

19. පැරණි ගිවිසුමේ සාමය සඳහා භාවිතා කළ හෙබ්‍රෙව් වචනය වන්නේ,
(i) අබාද් (ii) ෂමාර් (iii) ශාන්තිය (iv) ෂාලොම්

20. ගොඩමස් වැළකීමට නියමිත දින ඇතුළත් පිළිතුර වන්නේ,
(i) අළු බදාදා / ගොඩ් ඉරිදා (ii) අළු බදාදා / මහ සිකුරාදා
(iii) අළු බදාදා / මහ බ්‍රහස්පතින්දා (iv) අළු බදාදා / අවුරුද්දේ සෑම අඟහරුවාදා දිනකම

## පිළිතුරු

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | (iii) | 04. | (i) | 07. | (i) | 10. | (iii) | 13. | (iii) | 16. | (ii) | 19. | (iv) |
| 02. | (iv) | 05. | (ii) | 08. | (iv) | 11. | (iv) | 14. | (ii) | 17. | (iv) | 20. | (ii) |
| 03. | (iii) | 06. | (ii) | 09. | (i) | 12. | (ii) | 15. | (iii) | 18. | (i) | | |

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
ආචාරිනී - මිනු/ ශ්‍රී ඥානෝදය ම.ම.වි. - දිවුලපිටිය.

## අ.පො.ස. (උ./පෙළ) ක්‍රිස්තියානි ධර්මය
## විශ්ව සභා ඉතිහාසය I

### ක්‍රිස්තු ශාසනයේ ආරම්භය

ක්‍රිස්තුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු ව අපෝස්තුලුවරු ඇතුළු 120ක් පමණ පිරිසක් ශුද්ධාත්මයාණන්ගේ ආගමනය බලාපොරොත්තු වූහ. එයට හේතු වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ ඉල්ලීමකි. එනම් ජෙරුසලමෙන් ඉවත්ව නොගොස් පියාණන් වහන්සේගේ පොරොන්දුව බලාපොරොත්තුවෙන් පසු වන්න යැයි පෙන්වා දුන් හෙයිනි. දින 50 කට පසු ව ජෙරුසලමේ සිටි ඒ පිරිස අතරට ශුද්ධාත්මයාණන්ගේ වැඩම කිරීම සිදු විය. මේ සඳහා යෙදෙන ග්‍රීක් වචනය "පෙන්තේකොස්තේ" ය. ඉන් පෙන්වා දෙන්නේ පනස් වැනි යන අර්ථයකි. (අපෝ. ක්‍රියා 2/1 - 4) මේ සිදුවීම පෙර සිටි ජෝවෙල් දිවැසිවරයා පැවසූ දෙය ඉටු වීමකි. (ජෝවෙල් 2/28 - 32) එදින ඒ කුටියේ ඇති වූ විශේෂ සිදුවීම් 3 කි.

1. සැඩ සුළඟක් හමන ශබ්දයක් ඇසීම.

2. රැස්ව සිටි සියලුදෙනාගේ හිස මත ගිනි දලු පතිත වීම.

3. අපෝස්තුලුවරුන් තම තමන්ගේ භාෂාවෙන් කතා කරන විට විවිධ ජාතීන් ඔවුන්ගේ භාෂාවෙන් තේරුම් ගැනීම.

මේ ශුද්ධාත්ම ආගමනයත් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ දහම සීමා මායිම් අබිබවා විශ්වීය දහමක් බවට පත් විය. එමෙන් ම අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ (2/14 - 21) අනුව ක්‍රිස්තුස් වහන්සේ මෙසියස් බවත් උන්වහන්සේගේ උත්ථානයට අපෝස්තුලුවරුන් සාක්ෂිකරුවන් බවත් තහවුරු කෙරිණි. ක්‍රිස්තු ශාසනයේ ආරම්භය සිදුවන්නේ ජෙරුසලමේදීය. ආරම්භ වූ වර්ෂය ක්‍රි. ව. 30 - 33 අතර කාලයක යයි සිතිය හැකිය. මේ සිදුවීමෙන් පසු සුවිශේෂ බලයක් එනම් ආත්මානුභාවයක් දෙවියන් වහන්සේගෙන් අපෝස්තුලුවරුන්ට ලැබුණි.

### ආරම්භක අවධියේ ක්‍රිස්තු ශාසනයේ ලක්ෂණ

පේදුරු තුමාගේ ප්‍රථම දේශනයෙන් 3000කට අධික පිරිසක් ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් මත පදනම් ව අදහාගෙන බව්තිස්මය ලබා සභාවට එක් විය. ඔවුන් ජෙරුසලම අවට සුබාරංචිය ප්‍රකාශ කිරීමේ කටයුතුවල නිරත වුණි. අපෝ. ක්‍රියා 2/42 වගන්තියෙන් පෙන්වා දෙන පරිදි මුල් අපෝස්තලික සභාව ඉගැන්වීමෙහි, සහභාගිකම හි, රොටි කැඞීමෙහි සහ යාච්ඤාවෙහි නිරත වී ඇත. ඔවුහු තම තමන්ට අයිති දේපළ පොදුවේ පරිහරණය කළහ. හැමදෙන ආදර්ශවත් ජීවිතයක් ගත කළහ. මෙලෙස සභාව දිනෙන් දින වර්ධනය විය.

### තේවචාර්යවරුන් (උපස්ථායකයන්) 7 දෙනකු පත් කිරීම.

සුබාරංචිය ප්‍රකාශ කිරීම හා සහනාධාර බෙදා දීම යන කාරණ ඉටු කිරීමේදී අපෝස්තුලුවරුන් අතින් අඩුපාඩු සිදු විය. ඒ තත්ත්වය තේරුම් නොගත් ග්‍රීක් බස කතා කරන ජුදාවරු තම වැන්දඹුවන් නොසලකා හරින බවට පේදුරු තුමා වෙත ගොස් පැමිණිලි කලහ. මන්ද අපෝස්තුලුවරුන් සහනාධාර බෙදාදීමේදී ග්‍රීක වැන්දඹුවන් හට ඇතැම් විට සහනාධාර නොලැබුණි. අපෝස්තුලුවරුන් පෙන්වා දුන්නේ සුබාරංචිය ප්‍රකාශ කිරීම අතපසුකොට සහනාධාර බෙදා දීමට තමන් කාලය ගත කිරීම නුසුදුසු බවයි. මේ නිසා පේදුරුතුමාගේ තීරණය වූයේ සුබාරංචිය ප්‍රකාශ කිරීමට හා බව්තිස්ම දානය කිරීම පමණක් අපෝස්තුලුවරුන්ට පවරා සහනාධාර බෙදා දීමට උපස්ථායකයන් පිරිසක් පත් කිරීමය. ඒ අනුව පත් කළ උපස්ථායකයෝ 7 දෙනෙකි. අපෝ. ක්‍රියා 6 / 1 - 7 පෙන්වා දෙන පරිදි ඔවුන් මෙසේ ය.

1. ස්තේපන්
2. පිලිප්
3. ප්‍රොකෝරස්
4. නිකනෝර්
5. තීමොන්
6. පර්මෙනස්
7. නිකොලස්

මේ අය අතරින් ස්තේපන් හා පිලිප් සුබාරංචිය දේශනා කිරීමටත් බව්තිස්ම දානය කිරීමටත් යොමු වූහ.

## ජුදාවරුන් ක්‍රිස්තු ශාසනයට පීඩා කිරීම

අපෝ. ක්‍රියා පොතේ 6 / 11 - 15 පෙන්වා දෙන පරිදි ජෙරුසලමේ සිටි ජුදා වරු (සද්දුසිවරු, පරිසිවරු, විනයධරයෝ හා නායක පූජකවරු) ක්‍රිස්තු භක්තිකයන්ට පීඩා එල්ල කරන්නට වූහ.

ජුදා පීඩනය යනුවෙන් පෙන්වා දිය හැක්කේ ජුදයන් ක්‍රිස්තු භක්තිකයන්ව ප්‍රතික්ෂේප කිරීමය. එයට ප්‍රධාන හේතුව ජුදාවරුන්, ක්‍රිස්තුස්වහන්සේව මෙසියස් ලෙස පිළිගැනීමට තිබූ අකැමැත්තයි. තවත් පැතිකඩකින් පෙන්වා දිය හැක්කේ ඉහත නම් කළ සමාජ කණ්ඩායම් ඔවුන් සතු බලය අහිමි වේ යයි ඇති වූ බිය නිසා ය. ඔවුන් කිතුනුවන්ට චෝදනා කළේ රෝම අධිරාජ්‍යයේ පාලනයට හේතුව ක්‍රිස්තුස් වහන්සේව මෙසියස් ලෙස පිළිගැනීම නිසා අත් කර ගත් පාපයට ලැබූ දේව ශාපයක් බවය.

මෙලෙස ජුදාවරු කිතුනුවන් සමග ගැටුම් ඇති කර ගත්හ. එහි විපාකය වූයේ උපස්ථායකයකු වූ ස්තේපන්තුමාව ඝාතනය කිරීමයි (අපෝ. ක්‍රියා 7/54 - 60). එතුමා ශුද්ධ වූ සභාවේ ප්‍රථම ප්‍රාණ පරිත්‍යාගී වරයාය. හෙරෝද් අග්‍රිපා රජු විසින් මහා ජාකොබ් තුමා කඩුවෙන් කපා මරා දමන ලදී (අපෝ. ක්‍රියා 12/1 - 3). මින් බියට පත්වූ ක්‍රිස්තු අනුගාමිකයෝ ජෙරුසලමෙන් පිට වී විසිරී ගොස් දේශය අභ්‍යන්තරයේ සැඟවුණහ (අපෝ. ක්‍රියා 8/ 4 - 5). ඔවුහු සැඟවුණු ස්ථානවල සුබාරංචිය ප්‍රකාශ කිරීමට පෙළඹුණහ.

ඒ අනුව ජෙරුසලමෙන් පිට ප්‍රදේශවල සුබාරංචිය ව්‍යාප්ත විය. එය සුබාරංචිය ව්‍යාප්තවීමේ ප්‍රථම අදියර ලෙස පෙන්වා දිය හැකිය. මෙහි දී පිලිප් තුමා සමාරියේ දහම් දෙසා මායාකාර සීමොන්ට බව්තීස්මය දානය කොට ඇත. පසුව පිලිප් සමාරියෙන් නික්ම ගාසා තීරයට බසින ප්‍රදේශය දක්වා ගොස් එතියෝපීය නපුංසකයාට බව්තිස්මය දානය කෙළේය (අපෝ. ක්‍රියා 8/26 - 40). පේදුරු තුමා තම දූත මෙහෙවරයෙහි යෙදෙමින් කායිසාරියේ ජීවත් වූ ඉතාලි භට හමුදාවේ ශතාධිපතියකු වූ කොරනේලියස් හට බව්තීස්මය දානය කෙළේය. (ශතාධිපතියා යනු හමුදා භටයන් 100 කට අධිපති ලෙස ක්‍රියා කරන පුද්ගලයාය.)

## ක්‍රිස්තුස් ශාසනය සුළු ආසියාවේ ව්‍යාප්තිය. (අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත)

ක්‍රිස්තුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසුව ශුද්ධවූ පාවුලු තුමා ඇතුළු පිරිස උතුරු මධ්‍යධරණී ප්‍රදේශ, සුළු ආසියාව, සිරියාව, තුර්කිය ඇතුළු අවට රාජ්‍යවල සුබාරංචිය ප්‍රකාශ කර ඇත. මුල් කිතුනු සභාව බිහිවීමේ සිට වසර 30 කාලයක් පුරා සිදු වූ තොරතුරු අපෝ. ක්‍රියා පොතේ සටහන් වී ඇත. පාවුලු තුමා සිරගත වීම දක්වා ආරම්භක තොරතුරු මේ පොතේ අන්තර්ගත වේ. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත ලූක් සුබාරංචියේම දිගුවකි. පොතේ රචකයා ලූක් නම් වෛද්‍යවරයකු බව පිළිගැනීමයි. ලූක් තුමා පාවුලු තුමාගේ ධර්මදූත ගමන්වලදී සහාය දැක් වූ පුද්ගලයෙකි. අන්තියෝකිය සම්ප්‍රදායට අයත් ලූක් තුමා ක්‍රිස්තු වර්ෂ 63 - 70 අතර කාලයේදී අපෝ. ක්‍රියා පොත සම්පාදනය කොට ඇත. රෝමයේ දී ලියා ඇතැයි සැලකෙන ඒ පොත ක්‍රිස්තු ශාසනයේ ආරම්භය පිළිබඳ දීර්ඝ වාර්තාවක් සම්පාදනය කරයි.

## සාවුල් හෙවත් ශුද්ධ වූ පාවුලු තුමා

ක්‍රිස්තු වර්ෂ 5 - 10 අතර කාලයේ සිලිසියාවේ තාර්සස් නගරයේ උපත ලැබූ පාවුලු ග්‍රීක් හා ආරාමීය භාෂා කතා කරන හෙලනිස්ත පසුබිම ට අයත් වූ ජුදෙව්වෙකි. එතුමා තම පියාගෙන් හිමිවන රෝම පුරවැසිභාවය ලබා ඇත. බෙන්ජමින්ගේ ගෝත්‍රයට අයත්ය. එතුමා තරුණ වියට පත් පත් වීමත් සමග සෙන්හෙඩ්‍රින් සභාව හෙවත් ජුදා මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයකු වූ ගමාලියෙල් නම් ව්‍යවස්ථාව දැන උගත් රබ්බි වරයකු වෙත ගොස් ව්‍යවස්ථාව පිළිබඳ අධ්‍යයනය කොට ඇත. එතුමා ගේ වෘත්තිය වූයේ කූඩාරම් කර්මාන්තය යි. පාවුලුගේ තවත් නාමයක් වූයේ සාවුල් ය. පලස්තීනයේ ජුදා පීඩන සමයේ දී සාවුල් නායක පූජකයන්ගෙන් බලපත්‍රයක් ලබාගන්නා ලද්දේ ක්‍රිස්තු භක්තිකයන් අල්ලා සිර භාරයට ගැනීමටය. දිනක් සාවුල් ජෙරුසලමේ සිට දමස්කය බලා යන අතර තුර හදිසියේ දුටු දර්ශනයකින් ඇසුණු හඬ සාවුල්ගේ සිත් හැරීමට හේතු විය. ඒ හඬ ක්‍රිස්තුස් වහන්සේගේ ය. එතැන් සිට සාවුල් යන නාමය පාවුලු ලෙස වෙනස් විය. තමන්ගේ සිත් හැරීමට මූලික හේතුව තමන්ට ක්‍රිස්තුස් වහන්සේව සෘජුව ම දර්ශනය වීම යැ යි එතුමා පවසයි.

**සටහන - එස්. හේමාල් පෙරේරා**

# පාඨක හඬ

"නිර්මල මරිය සරණයි!"

ගෞරවනීය සෙනෙහසින් එමාඩ් දල්පතාදු පූජා ප්‍රසාදින් වහන්සේ වෙතට,

වසංගත සමයට පසුව එවන ලද අපගේ ආදරණීය "භක්ති ප්‍රබෝධනය" සඟරා දෙකම මා අතට පත්වුණා. ඊට ස්තුතියි. බොහෝ පින්.

සැප්තැම්බර් කලාපය සඳහා තේමා කරගත් පවුල නැමැති මාතෘකාව ඉතා අගෙයි. අපේ සහෘද හමුවේදී ගරු ඔබ වහන්සේ අදහස් කළ විද්‍යාත්මක ක්‍රමවේදය මැනැවින් මට අවබෝධ වුණා. සැප්තැම්බර් කලාපයේ මුල් කවරයේ රූපය, අදහස, පණිවිඩය, සන්නිවේදනය විශිෂ්ටයි. ඒ පිටකවර සිතුවමේ මධ්‍ය ලක්ෂ්‍යය ලෙස මම දකින්නේ කුඩාම දරුවා හෙවත් පවුලේ බාල සාමාජිකයායි.

කුඩා දරුවන් දෙදෙනා අතර සංවාදය මුළු පවුලම රස ගන්වනවා. ප්‍රබෝධ කරනවා. කුඩා දරුවාගේ අතේ ඇති මුල්ලුවේ දත් දරුවා පසට හැරී තිබීමෙන් ඡායාරූපයේ දුර්ලභ හා දක්ෂ බවත් පෙන්වනවා. මේ පිටකවරය තුළින්ම "භක්ති ප්‍රබෝධනය" සඟරාවේ ප්‍රගතිය හා ප්‍රමිතිය මැනැවින් ප්‍රකාශ වෙනවා. ඊට යොදාගත් ගීතයද සෞන්දර්යාත්මකයි. වැඩි දෙනකුගේ කතා බහට ලක්නොවන, එහෙත් ශිල්පීය ගුණාත්මක භාවයෙන් පොහොසත් සෝමතිලක ජයමහ සංගීතවේදියාණන් ඔසවා තැබීම ඉතා සතුටුදායකයි.

ගරු සිසිල් ජෝයි පෙරේරා පූජා ප්‍රසාදින් වහන්සේගේ හා මොරිස් බොල්ලෑගලයන්ගේ ලිපි අර්ථසාරයෙන් පූර්ණයි. ඔවුන් පවුල යනු තේමාවකට වඩා දේව දීමනාවක් සම්පතක් ලෙස මැනැවින් හඳුනාගෙන ලිපි සකස් කර තියෙනවා. අනෙක් ලිපිද ඉතාම සාර්ථක ආදර්ශවත් පවුල් දිවියකට මඟ පෙන්වන කැඩපතක් සේ නිර්මාණය කර තියෙනවා. මේ අතර ලේඛන කලාවට ආධුනිකයකු ලෙස දොරට වඩින ඇසළ කුරේ නි.ම.නි. දෙව්සත්හලේ ශිෂ්‍යයාට ඔබවහන්සේ යම් මාවතකට ආලෝකය සපයා දීම නම් ප්‍රශස්තයි. එම ශිෂ්‍යයා අප රටේ උද්ගතව ඇති දේශපාලනික සමාජීය හා ආධ්‍යාත්මික ගැටලු මැනවින් හඳුනාගෙන අරුතින් ගෙත්තම් කර තිබීම පැසසුම් සහගතයි. ඒ අතර ලේඛක සමබරතාවටත් එය මහඟු රුකුලක්.

සපුගස්කන්දේ රංජිත්, වසර තිහකට ආසන්න කාලයකදී එකම එක වරක් මට හමු වූ අපූරු සුන්දර මිනිසෙක්. ඒත් අප හුවමාරු කරගෙන ඇති ලිපි සිය ගණනක්. මෙවර ඔහු "ඔබේ ඇදහීම හා මගේ ඇදහීම" යන දර්ශන කාව්‍ය "භක්ති ප්‍රබෝධනය" සඟරාවට ඇතුළත් වීමද අභියෝගාත්මකයි. ඔහුට හඬක් නැගීමට ගරු ඔබවහන්සේ පසුබිමක්, වේදිකාවක් තැනීමම ඒ අභියෝගයට මුහුණ දීමයි. මටසිලිටු කාව්‍යවලට මෙන්ම රංජිත් සොහොයුරාගේ ශෛලියේ කාව්‍ය සඳහාද තැනක් අවැසි බව මා නිතර සිහිපත් කළා. ඔබවහන්සේ ඊට දැන් දොර විවර කර තියෙනවා.

ජේසු පිහිටයි!

**මංගල ජයවර්ධන**
ගිංතොට

# ආශිර්වාදලත් රෝමාණු කතෝලික විවාහයක්

## සඳහා විවාහ අපේක්ෂකයකු/අපේක්ෂිකාවක් සොයනා

## රෝමාණු කතෝලික ඔබ සඳහාම පමණක් වෙන්වූ

**විශ්වාසනීය, ක්ෂණික, තොරතුරු හා පෞද්ගලිකත්වයට උපරිම ආරක්ෂාවක්**
**සහිත අසමසම ඩිජිටල් මොබයිල් ඇප් සේවාව**

# www.kithunu.com



**මෙම සේවාව ලබා ගත හැක්කේ මීසම් භාර රෝමාණු කතෝලික පියතුමකු හරහා තහවුරු කරගත් රෝමාණු කතෝලික අය හට පමණී. දින 7 ක නොමිලයේ ට්‍රයල් පැකේජ සේවාව ලබා ගත හැක. පසවු කාලසීමාව හෝ සම්බන්ධතා ගණන මත පදනම් වූ කැමති පැකේජයකට සුලු ගාස්තුවක් ගෙවා සේවාව පවත්වාගෙන යා හැක. අමතර සැඟවුනු ගාස්තු කිසිවක් නොමැත.**

PC / Laptop Version
https://app.kithunu.com

GET IT ON
Google play

# 0117-483-899

**Kithunu**
Putting Faith Back Into Marriage

**PC / LAPTOP VERSION**
**https://app.kithunu.com**

# කුරුණෑගල ජෝසප් වාස් උසස් අධ්‍යාපන ආයතනය

මෙහෙයවනු ලබන



# ද්වි මාසික නේවාසික ඉංග්‍රීසි පාඨමාලාව



ව්‍යාකරණ, කතනය, භාෂා උච්ඡාරණය, ලිවීම, සවන්දීම පිළිබඳව
ප්‍රමාණවත් දැනුම් සම්භාරයකින් සිසු සිසුවියන් සන්නද්ධ කරවන
**ද්වි මාසික පූර්ණ ඉංග්‍රීසි පාඨමාලාව සමගින්:**

සදාචාරාත්මක පැවතුම් සහ යහපත් පෞරුෂත්වයකින් සිසු සිසුවියන්ගේ ජීවිත හැඩගන්වීම සඳහා:

- Emotional Intelligence
- Presentation Skills
- Soft Skills
- Counseling
- Social Etiquettes
- Leadership Training

**දේශන මෙහෙයවීම: කතෝලික පූජාප්‍රසාදීවරුන්, කන්‍යා සොහොයුරියන් සහ ප්‍රවීන කථිකාචාර්යවරුන්**








පාඨමාලා ආරම්භය : උ/පෙළින් පසු නොවැම්බර් 8
සා/පෙළින් පසු ජනවාරි 25
පන්නල IHFC මධ්‍යස්ථානයේදී







**විමසීම්:** Very Rev.Fr.Sagara Prishantha Perera - Director :
Joseph Vaz Institute , St.Anne's Street, Kurunegala
Mobile: 071 70 300 77 | Fixed: 037 2223961 |
Web:www.jvi.lk | Email:director@jvi.lk



"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.
පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. Q/D/03/පුවත්/2020